

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කැළණිය විශ්ව විද්‍යාලය

தொல்பொருளியல் பட்டப்பின்படிப்பு நிறுவகம்

களனிப் பல்கலைக்கழகம்

POSTGRADUATE INSTITUTE OF ARCHAEOLOGY

UNIVERSITY OF KELANIYA

වාර්ෂික වාර්තාව 2024

வருடாந்த அறிக்கை 2024

ANNUAL REPORT 2024

වාර්ෂික වාර්තාව **2024** **3** - 80

வருடாந்த அறிக்கை 2024 81 - 175

Annual Report 2024 176 - 260

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

කැළණිය විශ්ව විද්‍යාලය

වාර්ෂික වාර්තාව

2024

කෙටි යෙදුම්

AD	Anno Domini
AHRC	Archaeological Heritage Research Cooperation
BC	Before Christ
CCF	Central Cultural Fund
CNRS	French National Center for Scientific Research
FSPI	French Sri Lanka Principal Investigator
HABCOM	Human and Biosphere Commission
HOL	Holocene
ICCROM	International Centre for the Study of the Preservation and Restoration of Cultural Property
ICOMOS	International Council on Monuments and Sites
ICT	Information and Communication Technology
IFP	French Institute of Pondicherry
INQUA	International Quaternary Union
ISSN	International Standard Serial Number
JAS	Journal of Archaeological Science
JAS-REP	Journal of Archaeological Science Report
LCMA	Laboratory for Cultural Material Analysis
LED	Light-Emitting Diode.
MA	Master of Arts
MPhil	Master of Philosophy
MSc.	Master of Science
NGO	Non-Governmental Organization
NIE	National Institute of Education
OPA	Organization of Professional Association
PALAEO	Palaeoecology
PALBO	Palaeobotany
PG. Dip	Postgraduate Diploma
PGIAR	Postgraduate Institute of Archaeology
PhD	Doctor of Philosophy
SCI	Science Citation Index
SEDRIC	Social Ecological Dynamic in Rapid Economic Development
SEDRIC Infrastructure	Social Ecological Dynamics in Rapid Economic Development and coastal Change in South eastern Sri Lanka
SEN	Sendalpaliyan in Chennai
SLQF	Sri Lanka Qualification Framework
UK	United Kingdom
UMO	Upper Ma Oya
USA	United States of America
YOMB	Yan Oya Middle Basin Mortuary Archaeology Research Project

01. දැක්ම

දකුණු ආසියාවේ පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයයන්හි පර්යේෂණයෙහිහා උසස් අධ්‍යාපනයෙහි විශිෂ්ටතා කේන්ද්‍රස්ථානය බවට පත් වීම

02. මෙහෙවර

(1) අතීතයෙන් උරුම වූ සුවිශේෂ දැනුම් සම්භාරය වර්තමාන ප්‍රයෝජනය සඳහා ගෙනහැර දැක්වීමට සිසු සිසුවියන් පුහුණු කිරීම

(2) ගෝලීය පුරවැසියන් ලෙස සමෘද්ධිමත් වීමට අවශ්‍ය දැනුම, ප්‍රඥාව සහ කුසලතා ඔප් නංවන විශිෂ්ට අධ්‍යාපනයක් කලාපය පුරා ව්‍යාප්තව සිටින සිසු සිසුවියන්ට ලබා දීම;

(3) පුරාවිද්‍යාව හා ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම, බෙදා හැරීම සහ යෙදවීම සඳහා නායකත්වයට කැපවී සිටීම;

(4) ශිෂ්‍යත්ව, පර්යේෂණ, උගත් වෘත්තීන්, රාජ්‍ය අංශය, ව්‍යාපාර සහ නව්‍යකරණයන්හි ශ්‍රී ලංකාවේ උරුමය පිළිබඳ අවබෝධයක් ඇති අනාගත පරපුරේ නායකයින් සංවර්ධනය කිරීම.

03. සංයුක්ත අරමුණු

අරමුණු 1

- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරාවිද්‍යා විශේෂීකරණයන් විවධාංගීකරණයට ලක් කිරීම
- පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ගුණාත්වයෙන් ඉහල සිසුන් ආකර්ශණය කරගැනීම

අරමුණු 2

- පුරාවිද්‍යාව, කෞතුකාගාරවිද්‍යාව, කලා ඉතිහාසය සහ උරුමයන් පිළිබඳ අන්තර් ආයතනික වැඩ සටහන් සැලසුම් කිරීම, දියත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම
- විධිමත් ලෙස මෙන්ම වෙනස් ආකාරයන්ගෙන්ද සුදුසුකම් ලත් සිසුන් ආකර්ෂණය කරගනිමින් පුරාවිද්‍යාව, කෞතුකාගාරවිද්‍යාව, කලා ඉතිහාසය සහ උරුමයන් යන ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපනය උදෙසා වන කාර්යක්ෂම, මනා කළමණාකරනයෙන් යුත්, එසේම භාවිතා කරන්නන් හට පහසු ආයතනයක් බවට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පත් කිරීම

අරමුණු 3

- රජයේ මෙන්ම පුද්ගලික ආයතනයන් උදෙසා පුරාවිද්‍යා උරුම කලමණාකරනයට අදාල තොරතුරු සඳහා ප්‍රවේශය වර්ධනය කිරීම සහ සේවා සම්පාදනය

අධ්‍යක්ෂකගේ පණිවුඩය



පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කරන ලද අවස්ථාවේ සිට පුරා වසර තිහකට අධික කාලයක් පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙහි අත්දැකීම් ලබමින් එහි කථිකාචාර්යවරයකු ලෙස සේවය කරමින් සිටි මා 2019 වසරේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉදිරි තෙවසරක කාලය සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. එම සුවිශේෂී සම්මුඛ පරීක්ෂණයේදී මම අධ්‍යක්ෂවරයා ලෙස මගේ පත්වීමත් සමග පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය බොහෝ මානයන්ගෙන් ඉදිරියට ගෙන යා හැකි බව සහ ගෙන යායුතු බව පවසා සිටියෙමි. අපේ අරමුණ වනුයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි බහුවිධ මුහුණුවරින් ගෝලීය ප්‍රවේශයක් වෙත ඔසවා තැබීමේ අරමුණ පෙරදැරිව පුරා දශක තුනකට වැඩි කාලයක් තිස්සේ සංවර්ධනය කරන ලද පුරාවිද්‍යා ක්ෂේත්‍රය කාර්ය මණ්ඩලයේ අදහස් සහ කළමණාකරණ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් සංවර්ධනය කිරීමයි. අපේ අභිප්‍රාය වනුයේ ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට මනාව සරිලන්නාවූ සිසුන් සහ පර්යේෂකයන් නිර්මාණය කිරීම හරහා ගොඩබිම සහ ජලාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික ගුණාංගයන් ගෙන් සමන්විත පුරාවිද්‍යා සංවේදනයන්ගෙන් පිරිපුන් පුද්ගලයකු නිර්මාණය කිරීම සහ ඔහු ක්ෂේත්‍රයෙහි සක්‍රීය අයකු බවට පත් කිරීම මගින් පුරාවිද්‍යා ශික්ෂණය සහ අද දවසේ දැක්ම සහ ප්‍රතිපත්ති ප්‍රකාශය සමග මනාව සංයෝජනය කරමින් සියයකට ආසන්න අදාල මූලික සංකල්ප භාවිතා කිරීම මගින් තිරසර සංවර්ධනයක් පිණිස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඔසවා තැබීමයි.

ශ්‍රී ලංකාවේ උරුම කළමණාකරනය සහ පුරාවිද්‍යා ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරන්නාවූ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල වැනි ආයතනයන්හී අවශ්‍යතාවන් හඳුනාගනිමින් ජාතික අවශ්‍යතාවන්ට මනාව ගැලපෙන ප්‍රායෝගික මට්ටමේ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත උගතුන් නිර්මාණය කිරීම සහ ඔවුන් සමග නිරන්තරවම වැඩමුළු පැවැත්වීම, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමග සෘජු සම්බන්ධතා සහිත ස්මාරක සහ වැඩබිම් සඳහා වන ජාත්‍යන්තර සභාව ICOMOS, සංස්කෘතික දේපල සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය පිලිබඳ අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය ICCROM වැනි ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම සහ පුරාවිද්‍යා ඥයන්ගේ සභාව සහ ජාතික භාරය සමග සබඳතා පවත්වා ගනිමින් පුළුල් සබඳතා ක්ෂේත්‍රයක එක්සත් ආයතනයක් ලෙස ප්‍රගතිය කරා ගමන් කිරීම ආයතනයේ මූලික අරමුණ සහ අභිමතය වේ.

වර්තමාන ගෝලීය අවශ්‍යතාවන්ට මනාව ගැලපෙන නව විද්‍යාත්මක මුහුණුවරක් සහිතව පවත්නා පුරාවිද්‍යා සහ ඒ ආශ්‍රිත අධ්‍යයන වැඩ සටහන් වර්ධවය කිරීම, ශ්‍රී ලංකාවෙහි උරුමය හා සම්බන්ධිත අංශයෙහි අවශ්‍යතාවන් සපුරාලීම, වඩා විද්‍යාත්මක ආකාරයකින් නව අධ්‍යයන වැඩ සටහන් හඳුන්වාදීම නව තාක්ෂණය, නව උපාය මාර්ග, නව්‍යෝත්පාදන දැනුම හඳුන්වාදීම මගින් පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය වර්ධනය කිරීම, කථිකාචාර්යවරුන්ගේ අධ්‍යයන දැනුම සහ සිසුන්ගේ අධ්‍යාපන මට්ටම වර්ධනය කිරීම මගින් ගෝලීය මට්ටමට ළඟාවීම, සහ දෙවන පෙල වෘත්තීය ශිෂ්‍ය කණ්ඩායම් සහ උපාධි අපේක්ෂක සිසුන් නිර්මාණය කිරීම හරහා ආයතන ව්‍යුහය වර්ධනය කිරීම සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය අපේ පුළුල් අපේක්ෂාව වේ.

මේ හා සමගාමීව ජාත්‍යන්තර මට්ටමින් සිසුන් ආකර්ශණය කිරීම උදෙසා ජාත්‍යන්තර ප්‍රමිති ක්ෂේත්‍ර කාර්යයන් පුළුල් කිරීම සහ දැනටමත් අප සතුව පවත්නා, විදෙස් සරසවි සමග වන ස්ථාපිත අවබෝධයන් සහ සබඳතා ශක්තිමත් කරමින් මේ ආයතනය ශ්‍රී ලංකාවෙහි පුරාවිද්‍යා සහ උරුම කළමණාකරනය පිලිබඳ අධ්‍යයන කේන්ද්‍රය බවට පත්කිරීමද මගේ කාර්ය භාරය අතර වේ.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අදිකාරී. (Phd, FSLCA)

පටුන

පිටු අංකය

1 කොටස: හැඳින්වීම 8

2 කොටස: කළමනාකරණ මණ්ඩලය 9

3 කොටස: සංවිධාන සටහන 10

4 කොටස: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අභ්‍යන්තරය 11

04.1 පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනයේ වටිනාකම් 11

04.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම 11

04.3 ආයතනයේ කාර්යසාධනය ඉහළනැංවීම සඳහා අනුගමනය කිරීමට යෝජනා කරඇති කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ගවල මැනියහැකි සාරාංශය 11

04.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය 12

04.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය 13

04.6 තිරසර සංවර්ධන වාර්තාව - පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතු 13

04.7 තිරසරභාවය මත පදනම්ව අනාගත පුරෝකථන වාර්තාව 15

5 කොටස: සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර 18

6 කොටස: දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර 20

7 කොටස: කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 20

8 කොටස: වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර 21

9 කොටස: ලබාගත් සම්මාන පිළිබඳ විස්තර 22

10 කොටස: රැස්වීම් පිළිබඳ විස්තර 22

11 කොටස: පර්යේෂණ ව්‍යාපෘති

අ). පු.වි.ප.උ.ආ පර්යේෂණ අංශය මගින් පවත්වන ලද පර්යේෂණ ක්‍රියාකාරකම්හිප්‍රගතිය 22

ආ) පු.වි.ප.උ.ආ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලද විවිධ වැඩමුළු සහ 22 ක්ෂේත්‍ර චාරිකා 24

ඇ) ජාතික සහ ජාත්‍යන්තර සම්මාන 27

ඈ) පොදු ප්‍රකාශන උදෙසා පලකිරීම් 28

ඈ) 1. ජාතික මට්ටමේ වැඩ සටහන් සමග සහයෝගීතාව

ඈ) 2. ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සහයෝගීත්වය (NIE)/මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්ය මණ්ඩලය පුහුණුකිරීම 29

ඉ) අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ප්‍රකාශන 31

12 කොටස: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විමර්ශන පුස්තකාලය 33

13 කොටස: මූල්‍ය ගිණුම් 2024 37

14 කොටස: විගණකාධිපතිවරයාගේ වාර්තාව 72

01. හැඳින්වීම

පුරාවිද්‍යාත්මක පර්යේෂණ සඳහාවන කේන්ද්‍රස්ථානය වනුයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය(PGIAR) යි. පුරාවිද්‍යාත්මක පර්යේෂණ සඳහාවන කේන්ද්‍රස්ථානය වේ. පුරාවිද්‍යාත්මක පර්යේෂණ යනු සමාජවිද්‍යාවේ ප්‍රධාන අංශ, මානවශාස්ත්‍ර හා අභිලේඛන, සංඛ්‍යාශාස්ත්‍ර, චිත්‍ර, කලා-ඉතිහාසය, ඓතිහාසික පුරාවිද්‍යාව, සමාජ පුරාවිද්‍යාව, සංරක්ෂණය, ප්‍රාග් ඉතිහාසය, උරුම අධ්‍යයනය, කෞතුකාගාර අධ්‍යයනය වැනි පිරිසිදු විද්‍යාවන් මත පදනම්ව අපගේ විශේෂයේ ඉතිහාසය (මානව වර්ගයාගේ අතීතය)හෙළි කිරීමට සහ ඉතිහාසය නම්වූ ග්‍රන්ථයේ අස්ථානගත වූ පිටු සොයා දීම සඳහාවූ මාර්ගයකි. 1986 වර්ෂයේ දී ආරම්භකරන ලද මෙය, පුරාවිද්‍යාවන් පිළිබඳ ගෝලීය පරිමාණයෙන් සක්‍රියව පර්යේෂණ සිදුකරන ශ්‍රී ලංකාවේ පිහිටිආයතන කිහිපය අතරින් එකකි. ජෛවවිද්‍යාත්මක ඒකාබද්ධ ප්‍රවේශයන් සමඟ පෞරාණික පරිසරවිද්‍යාව, විවිධ අංශ සහ පරාග පිළිබඳ පුරාවිද්‍යා අධ්‍යයනයන්, පෞරාණික දේශගුණය, පෞරාණික පාරිසරික වෙනස්කම්, ලෝහවිද්‍යාව, මිහිදන්ව ගිය දේ පිළිබඳ පුරාවිද්‍යා අධ්‍යයනයන්, අස්ථි පිළිබඳ පුරාවිද්‍යාව සහ පින්තාරු සංරක්ෂණය වැනි පුරාවිද්‍යාවිද්‍යාවේ නව ප්‍රවණතා සඳහා කටයුතු කරන එකම ආයතනය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය වේ. “Journal of Archaeological Science”, “Quaternary International, Quaternary Science Reviews”, “Journal of Quaternary Science and Journal of Palaecology”, Palaeogeography and Palaeoclimatology”වැනි ඉහළ බලපෑමක් සහිත දර්ශක සඟරා ප්‍රකාශනවල පිළිබිඹුවන පරිදි පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය පර්යේෂණ හා අත්දැකීම්වල විශිෂ්ටත්වය සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්ව ඇතිබව මෙයින් ඇඟවෙයි.



මෙම පසුබිම සමඟ ආයතනය උපාධිධාරී චින්තනයට සහ පර්යේෂණ සිසුන්ට විශිෂ්ට අධ්‍යයන පරිසරයක් සපයයි. ආයතනයේ පවත්වාගෙනයනු ලබන පාඨමාලා අතරඩිප්ලෝමා, ශාස්ත්‍රපති, සහ විද්‍යාපති පාඨමාලා ඇතුළත්ය. පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, සහ විද්‍යාපති පාඨමාලා ඉගැන්වීම්, ක්ෂේත්‍ර හා රසායනාගාර වැඩසටහන් තුළ පූර්ණ ලෙස ඒකාබද්ධ වී ඇත. මෙම ආයතනය පුරාවිද්‍යාවේ පර්යේෂණ උපාධි (ශාස්ත්‍රපති, විද්‍යාපති, දර්ශනපති සහ දර්ශන විශාරද)සඳහා ඉහළින්ම පිළිගත් මධ්‍යස්ථාන අතරින් එකකි. අවසාන වශයෙන්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි වැදගත් මෙහෙවර වනුයේ අප රටේ අතීත ශිෂ්ඨාචාරය පිළිබඳ අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම සහ අපගේ ජාතිය ගැන අභිමානයක් ඇතිකරලීම සඳහා සහ අපගේ උරුමය ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුවත්වීම උදෙසා නව දැනුම මහජනයා වෙත ලබා දීමයි.

02. කළමනාකරණ මණ්ඩලය

නිල බලයෙන් පත්වූ සාමාජිකයන්:

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.එම්. ගාමිණි අධිකාරී-		අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
ඒ.පී.එස් දිලූෂා මිය (2024 ජනවාරි සිට 2024 නොවැම්බර්)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ,ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
එම්.ඩී.එන්.එස් ජයරත්න මයා (2024 නොවැම්බර් සිට අද දක්වා)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ,ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
මහාචාර්ය තුසිත මෙන්ඩිස් (2024 ජනවාරි සිට අද දක්වා)	-	අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
මහාචාර්ය බණ්ඩාර වන්නිනායක (2024 ජනවාරි සිට අද දක්වා)	-	පීඨාධිපති, වාණිජ සහ කළමණාකරන අධ්‍යයන පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය
එච්.ඩී.සී ජානකී මිය (2024 ජනවාරි -2024 පෙබරවාරි)	-	අධ්‍යක්ෂ, (ශිෂ්‍ය ණය) (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය) අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)
එස්.ඩී.එන්.එස් ජයසේන මිය (2024 ජනවාරි -2024 දෙසැම්බර්)	-	අධ්‍යක්ෂ, (ශිෂ්‍ය ණය) (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය) අධ්‍යාපන අමාත්‍යාංශය (උසස් අධ්‍යාපන අංශය)
ජ්‍යේෂ්ඨ මහාචාර්ය එන්.කේ.පී.ජේ සෙනෙවිරත්න		-පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය (2024 ජනවාරි -2024 ඔක්තෝබර්)
ජ්‍යේෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී කාලිංගමුදලි (2024 නොවැම්බර් සිට අද දක්වා)		-පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත්කරන ලද සාමාජිකයන්:

මහාචාර්ය එස් පද්මනාදන්	-හිටපු උප කුලපති, යාපනය විශ්ව විද්‍යාලය
සේවාර්ජිත මහාචාර්ය ටී ජී කුලතුංග	-සේවාර්ජිත මහාචාර්ය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
මහාචාර්ය ගාමිණී රණසිංහ	-අධ්‍යක්ෂ ජනරාල් මධ්‍යම සංස්කෘතික අරමුදල
මහාචාර්ය ඒ හරේන්ද්‍ර කාරියවසම්	-මූල්‍ය අධ්‍යක්ෂ, ලේක් හවුස් ආයතනය
මහාචාර්ය අජිතා තෙන්නකෝන් මිය	-විශ්‍රාමික මහාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය
සේවාර්ජිත මහාචාර්ය ඒ ඒ ඩී අමරසේකර	-සේවාර්ජිත මහාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය
සේවාර්ජිත මහාචාර්ය ජගත් වීරසිංහ-හිටපු අධ්‍යක්ෂ පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	
(2023 සැප්තැම්බර් සිට 2024 දෙසැම්බර් දක්වා)	

සහකාර ලේඛකාධිකාරී (ලේකම්)

කජෙන්තිනී තර්මන්ත් මිය-සහකාර ලේඛකාධිකාරී

(2023 ජනවාරි-2024 අප්‍රියෙල්)

එස්.පී.ඒ.යූ සෙනරත් මිය -ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී

(2024 මැයි සිට අද දක්වා)


ආරාධනය මත

එම්.බුලත්සිංහල මිය-ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති

එම්.කේ.ඩී ලක්මාලි මිය -ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී

ඒ.ආර් පබසරී මිය -සහකාර ලේඛකාධිකාරී

03. සංවිධාන සටහන


කළමණාකරන මණ්ඩලය
අධ්‍යක්ෂ
අධ්‍යයන මණ්ඩල
අධ්‍යාපන
විශේෂඥ ඒකකය
කලා සහ උරුම
සමාජ පුරාවිද්‍යාව
පාරිසරික පුරාවිද්‍යාව
ජෛව සහ භූ පුරාවිද්‍යාව
පුරාණ ලෝහ විද්‍යාව
ඓතිහාසික භූගෝල විද්‍යාව
අධ්‍යයන සහ පර්යේෂණ උපකාර පහසුකම්
සිතියම්ගත කිරීමේ සහ සැලසුම් ඇඳීමේ පහසුකම්
ප්‍රකාශන සහ තොරතුරු පහසුකම්
ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය මාධ්‍ය පහසුකම්
ක්ෂේත්‍ර වැඩ පහසුකම්
සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණ රසායනාගාරය
ශිෂ්‍ය පරිගණක පහසුකම්
අස්ථි විද්‍යාව සහ පුරාණ DNA පර්යේෂණ රසායනාගාරය
පුස්තකාලය
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්කාලයාධිපති
කාර්ය මණ්ඩලය
පරිපාලන
නියෝජ්‍ය ලේඛකාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
සහකාර ලේඛකාධිකාරී
කාර්ය මණ්ඩලය
මූල්‍ය
නියෝජ්‍ය මූල්‍යාධිකාරී/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
සහකාර මූල්‍යාධිකාරී
කාර්ය මණ්ඩලය

04. පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනයේඅභ්‍යන්තරය

04.1 පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනයේ වටිනාකම්

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ශාස්ත්‍රීය කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් මෙහෙයවනු ලබන පුරාවිද්‍යාවේ සහ ආශ්‍රිත විෂයයන්හි ශිෂ්‍යත්ව, නවෝත්පාදන හා සමාජ වගකීම් විශිෂ්ටත්වය පෝෂණය කරයි. එහි අගයන් පහත දැක්වේ:

විශිෂ්ටත්වය සඳහා කැපවීම සහ කුසලතා මත දියුණුව
සාධාරණත්වය, අවස්ථාව සහ සමානාත්මතාවය
විවිධත්වය
අධ්‍යයන අඛණ්ඩතාව සහ වෘත්තීයභාවය
සර්වග්‍රාහීබව
විවෘතභාවය
හැසිරීමේ සදාචාරාත්මකවපිළිගත හැකි ප්‍රමිතීන්
නවෝත්පාදන හා නිර්මාණශීලිත්වය පෝෂණය කිරීම
පරිපාලනයේ වගවීම සහ විනිවිදභාවය
නායකත්වය සංවර්ධනය කිරීම
පාරිසරික තිරසාරබව

04.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම

පුරාවිද්‍යාව සහ එහි විවිධ උප විෂයයන් පිළිබඳ අවබෝධය, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා මනාව අර්ථ දැක්වූ ක්‍රියාපටිපාටි සමඟ සම්බන්ධව උසස් තත්ත්වයේ අධ්‍යයන, කාර්යක්ෂම හා මිත්‍රශීලී පරිපාලන පරිසරයන් සමඟ සම්බන්ධවීමට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී ඔබට විශිෂ්ටඅවස්ථාවක් ලැබේ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ධාරිතාව තුළ උසස් තත්ත්වයේ ශිෂ්‍යත්ව, දැනුම බෙදාහැරීම සහ හොඳම සහ පළපුරුදු සමානයන් අතර වඩා හොඳ අධ්‍යාපනික අන්තර් සම්බන්ධතාවයක් ඇතිකිරීම සඳහා ඉතා සාධාරණ හා සමාන අවස්ථා ලබාදෙන පර්යේෂණ, ඉගැන්වීම් සහ අධීක්ෂණය සඳහා පුළුල් පරාසයක විද්වතුන් ඇතුළත් වේ.

04.3 ආයතනයේ කාර්යසාධනය ඉහළනැංවීම සඳහා අනුගමනය කිරීමට යෝජනා කර ඇති කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ගවල මැනියහැකි සාරාංශය:

4.3.1 පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය මේවනවිට පශ්චාත් උපාධි ආයතනයක් ලෙස එහි නිශ්චිත අවශ්‍යතා සපුරාලීමට හැකි පුළුල් අධ්‍යයන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනයකර ඇතිඅතර ශිෂ්‍යඅත්පොතක් ද සකස් කොට ඇත.

4.3.2 පුරාණ-දේශගුණය, පුරාණ -පාරිසරික වෙනස්කම් සහ සංඛ්‍යාත්මක හා අභිලේඛන අධ්‍යයනය සඳහා ප්‍රවේශය ලබා දීම සඳහා නවපාඨමාලා ඒකක දෙකක් හඳුන්වාදෙන ලදී.

4.3.3. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ක්ෂේත්‍ර චාරිකා සහ විද්‍යාගාරවල කටයුතු කිරීමට පශ්චාත් උපාධි සිසුන්ටඇති පහසුකම් සවිමත්කරන ලදී.

4.3.4. ජාත්‍යන්තර හා ජාතික ප්‍රජාවන් සමඟ එක්ව අධ්‍යයන ආධාරක වැඩසටහන් 7 ක් (සම්මන්ත්‍රණ සහවැඩමුළු)අවසන්කර ඇත. මේ සම්බන්ධයෙන්, අධ්‍යයන සාකච්ඡා, පර්යේෂණ සංසද සහ ප්‍රකාශන සඳහා වැඩිඅවස්ථාවන් ප්‍රමාණයක් ඇතිකර ඇත.

4.3.5. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ ප්‍රකාශන ගණනාවක් බිහිකිරීමට සමත්ව ඇතිඅතර ආයතනයේ සෑම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක්ම මේවනවිට ක්ෂේත්‍ර පර්යේෂණවල නිරතවසිටී. එක් එක් පීඨ සාමාජිකයා සඳහා ගූගල් විශාරද

දර්ශකය(Google scholar Index) සහ"Research Gate Accounts' සංවිධානය කර ඇත.

4.3.6. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට සමස්ත අධ්‍යයන වර්ෂයම කල්වේලා ඇතිව සැලසුම් කිරීමටත්, අනිවාර්ය වැදගත් සිදුවීම් බොහොමයක් කල්තියා සැලසුම්කර ඇති ස්ථීර අධ්‍යයන දින දර්ශනයක් ඉදිරිපත් කිරීමටත් හැකි වී තිබේ.

4.3.7. සාපේක්ෂ වශයෙන් එතරම් ප්‍රමාදයකින් තොරව විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට ආයතනයට හැකි වී ඇත.

4.3.8. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට එහි විෂය නිර්දේශ සංශෝධනය කිරීමටත් නව උසස් උපාධි පාඨමාලා හඳුන්වා දීමටත් හැකිවිය.

4.3.9. සිසුන් අතර අධ්‍යයන තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට තමන්ගේම නව සම්ප්‍රදායන් ආරම්භ කළහැකිවූ අතර ආයතනයේ කාර්ය මණ්ඩලය සහ පුරාවිද්‍යාඥයන්ගේ ප්‍රජාව අතර ප්‍රජා හැඟීමක් ඇතිකිරීම සඳහා සම්මාන ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට හැකිවිය.

4.3.10. පුරාවිද්‍යාව හා ආශ්‍රිත විෂයයන් සංවර්ධනය කිරීම සඳහා අද්විතීය ලෙෂ දායකවන පුද්ගලයින් සහ ආයතනයට කීර්තියක් ගෙනදෙන පුද්ගලයින් ඇගයීම සඳහා ආයතනය විසින් සම්මාන ප්‍රදානෝත්සවයක් ආරම්භකරන ලදී. සම්මාන ප්‍රදානය කිරීමේ යෝජනාක්‍රමය'PGIAR Brick Award'ලෙස හැඳින්වේ..

4.3.11. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයෙන් ලබා ගත් පොත් නිශ්චිත කාල සීමාවක් තුළ පුස්තකාලයට නැවත භාර දීම තහවුරු කිරීම සඳහා පුස්තකාල සාමාජිකත්ව පද්ධතියක් සකස් කිරීමට හැකිවූ අතර , පුස්තකාල ආරක්ෂාව වැඩිදියුණු කිරීමටත සහ පුස්තකාල අත්පොතක් සැකසීමටත් හැකිවිය .

4.3.12. ශ්‍රී ලංකාවේ හොඳම පුස්තකාලයකට ප්‍රවේශවීම සඳහා පුරාවිද්‍යාපශ්චාත් උපාධි ආයතන පුස්තකාලය විවෘත කරන ලද අතර පුස්තකාලයේ ඩිජිටල් දත්ත ගබඩාවපිළිබඳ නව වැඩසටහනක් සාකච්ඡා කෙරෙමින් පවතී.

4.3.13. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව, ජාල පද්ධතිය සහ අන්තර්ජාල ප්‍රවේශය ඇතුළත්ව මනා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පහසුකම් ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කෙරෙමින් පවතී.

4.3.14. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරකම්වලට වැඩි වශයෙන් සම්බන්ධවූ අතර රජයේ ආයතනවල උරුමයට සහ පුරාවිද්‍යාවට අදාළ විවිධ ගැටළු විසඳීමේ ව්‍යාපෘතිවලට සහභාගීවිය.

4.3.15. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය ප්‍රසිද්ධ දේශන වැඩසටහන සහ පදනම් පාඨමාලා වැඩසටහන සමඟ 'රාජ්‍ය ආයතනයක්' වීමේ තම දැක්ම යම් තාක්දුරකට සාක්ෂාත්කර ගැනීමට සමත් වී තිබේ.

04.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණය

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පහත් දැක්වෙන් විශේෂීකරණයන් උදෙසා පර්යේෂණ සහ ඉගැන්වීම් කටයුතු සිදු කරන අතර පුරාවිද්‍යා අධ්‍යයනයන් තවදුරටත් කරගෙන යාමට හෝ එහි නිරත වීමට අදහස් කරනා සිසුන්ට පහත විශේෂීකරණයන් අතුරින් තම කැමැත්ත පරිදි අදාල ක්ෂේත්‍රය තෝරාගත හැකිය.

පෞරාණික පුරාවිද්‍යාව

වාස්තු විද්‍යාව

ප්‍රාග් ඉතිහාසය

උරුම කළමණාකරනය

ස්මාරක සංරක්ෂණය සහ උරුම කළමණාකරනය

කලා ඉතිහාසය

පෞරාණික ලෝහ විද්‍යාව

පාරිසරික පුරාවිද්‍යාව

කෞතුකාගාර අධ්‍යනය

සමුද්‍රික පුරාවිද්‍යාව

04.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විශේෂීකරණ ඒකකය

සමස්ත සරසවි පද්ධතියටම සහ රටෙහි ඇති පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාල ආයතනයන්හි අවශ්‍යතා සපුරාලීම පිණිස පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පහත් දැක්වෙන් විශේෂීකරණ ඒකක පවත්වාගෙන යයි.

ක්ෂේත්‍ර පුරාවිද්‍යා ඒකකය
සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණය සඳහාවන විද්‍යාගාරය(LCMA)
පාෂාණීය ධාතු පරිසර විද්‍යාව(Palaeoecology) සහ ක්ෂුද්‍ර පුරාවිද්‍යා(Palynology) සඳහා විද්‍යාගාරය

04.6 තිරසර සංවර්ධන වාර්තාව - පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සහ අධ්‍යාපන කටයුතු

පුරාවිද්‍යා පශ්චාත් උපාධි සඳහා පවත්නා රැකියා අවස්ථා බෙහෙවින් සීමිත වුවද පුරාවිද්‍යාව සහ ආශ්‍රිත ශික්ෂණයන්හී ඉහල ගුණත්වයකින් යුත් උපාධි පිරිනැමීම මගින් ජාතික තිරසර සංවර්ධන නයාය පත්‍රයට සිය දායකත්වය සැපයීම පිණිස ආයතනය සෑම ප්‍රයත්නයක්ම දරා තිබේ. විශේෂයෙන්ම මෙහිදී මුහුණ දීමට සිදුවන අනේක විධ අභියෝගයන් සහ දුෂ්කරතා නොසලකා අතීත දේශගුණික තත්වයන් පිලිබඳ අවබෝධය, අතීත පරිසරය සම්බන්ධයෙන් මානව බලපෑම, ඉඩම් පරිහරණයේ ඉතිහාසය, ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාවන් හරහා පාරිසරික පුරාවිද්‍යා වැඩසටහන් තුළට පාරිසරික සහ මුහුදු මට්ටම් හී වෙනස්වීම් ඇතුලත් කිරීම වැනි අත්‍යවශ්‍ය විෂයයන් හඳුන්වාදීම සහ ඒවා සම්බන්ධයෙන් ඉගැන්වීමට සහ පර්යේෂණයන්ට කටයුතු සැලසීම මගින් සිය දායකත්වය සැපයීම මගින් ආයතනය තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට දායකත්වය සපයා තිබේ. මේ බොහෝ විෂයන් තුළින් නිපදවනු ලබනා දැනුම විද්වත් සමාලෝචන, සුචිගත ජර්නල් තුළ කරනා පලකිරීම් මගින් ගෝලීය සංදර්භයට අනාවරණය කර තිබේ.

මෙකී සංදර්භය තුළ, දිගු කාලයක් පුරා රටෙහි සිදුව ඇති පසුකාලීන චාතුර්තික දේශගුණික සහ පාරිසරික වෙනස්කම් ජාත්‍යන්තර වේදිකාවට ගෙන ඒම මගින් ශ්‍රී ලංකාව ඇතිකරගෙන තිබෙනා විශ්වාසය තුළින් කලාපීය තිරසරභාවය ඇතිකරගැනීම පිණිස වැදගත්වන දේශගුණික සහ පාරිසරික ප්‍රතිපත්ති හැඩගැස්වීම කෙරේ වන එහි දායකත්වය නිරූපණය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ විද්‍යාව සහ තාක්ෂණයෙහි පේලියෝ- පාරිසරික ක්‍රමානුකූල මූලාරම්භයන් වෙත නව දර්ශනයන් සම්පාදනය කරමින්, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පාරිසරික පුරාවිද්‍යා පර්යේෂණයන් එහි ශාස්ත්‍රාලීය සංදර්භය තුළ පමණක් නොව, පාරිසරික, ආර්ථික සහ ප්‍රජා සහභාගීත්ව සංදර්භය තුළද අවධානය දිනාගෙන තිබේ. තිරසර සංවර්ධන කෙරේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි ඇති කැපවීම තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයන්ට සහය වන එහි ඉගැන්වීම්, විෂයමාලාව, සහ පර්යේෂණ ක්‍රියාකාරකම් තුළින් පිලිබිඹුවන බව පෙනේ.

පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෝ (ජ්‍යෙෂ්ඨ ශාස්ත්‍රවන්තයන්) සහ පර්යේෂණයන්හී ආරම්භක අවධියේ පසුවන්නන් (පශ්චාත් උපාධි) මෝසම් කාලගුණය, තුරු ලතා, වනගහනයන්, සහ ඉඩම් පරිහරණ පද්ධති යනාදී විවිධ පාරිසරික සාධකයන්හී දිගුකාලීන ඉතිහාසය අවබෝධකරගැනීම තුළින් රටෙහි තිරසර සංවර්ධනය උදෙසා දැනුම සපයමින් ආයතනයේ දැක්ම ශක්තිමත් කිරීමට වෙහෙස නොබලා කටයුතු කරති. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි පර්යේෂණයට සහ ප්‍රවර්ධනයට ලක් කෙරෙනා පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා 2030 වසර සඳහා ඉලක්කගත කර ඇති එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක සමග සම්බන්ධ කර ඇති බව මෙයින් පෙනී යයි.

පරිසර ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මකව පවත්නා පාරිසරික නීති සහ ප්‍රතිපත්ති වලට ගරු කරමින් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවත්නා කුඩා පරිමාණ පාරිසරික පද්ධතිය මනා හිතකාමී ලෙස කළමණාකරනය කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. කුඩා ප්‍රදේශයක් තුළ ස්ථානගතව පැවතියද ඒ නොතකා, ප්‍රදේශය තුළ උත්පාදනය කෙරෙනා ඉහල කාබන් විමෝචනය අවම කිරීමට සෑම ප්‍රයත්නයක්ම දරා ඇත.

පර්යේෂණ සහ පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අමතරව, පාර්ශවකරුවකු ලෙස සිය ධාරිතාව තුළ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය උපාය මාර්ගයන් කිහිපයක් අදාල කරගනිමින් තිරසර සංවර්ධන ඉලක්ක වලට වටිනාකමක් එකතු කිරීම අරමුණු කරයි.

අ. නිතර භාවිතා කරනා ද්‍රව්‍ය හරහා වන කසල නිෂ්පාදනය අවම කිරීමට සිසුන් සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම

ආ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පරිශ්‍රය තුළ ප්ලාස්ටික් පරිහරණය අවම කිරීමට කාර්ය මණ්ඩලය සහ සිසුන් දැනුවත් කිරීම

ඇ. ඇතිවන කාබනික අපද්‍රව්‍යයන්ගෙන් සැලකිය යුතු කොටසක් කොම්පෝස්ට් නිෂ්පාදනය පිණිස යොමු කිරීම

ඈ. ලෝහ, වීදුරු, ප්ලාස්ටික්/පොලිතීන්, කරදාසි සහ කාබනික අපද්‍රව්‍යයන් වෙන වෙනම රැස් කිරීමට වැඩ පිලිවෙලක් සකසා තිබේ.

ඉ. මහ නගර සභාවේ උපකාරයද ඇතිව ඝන අපද්‍රව්‍ය කළමණාකරන පරිපාටිය නිතිපතා සිදුකරනු ලැබේ.

ඊ. ආයතනික හා අදාල පරිශ්‍රය තුළ දුම්බීම සපුරා තහනම් බව ආයතනයට ඇතුළු වන සියල්ලන්ටම දන්වා සිටීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

උ. වා තලයට සහ පසට මුදා හැරෙනා පාරිසරික දූෂණ කාරකයන් ඉතාම අවම මට්ටමින් පවත්වා ගැනීම පිණිස ප්‍රයත්න දරා තිබේ.

ඌ. ආයතනයේ බලශක්තිය කාර්යක්ෂම අන්දමින් භාවිතා කරන මෙන් සියළු සිසුන් සහ එහි පැමිණෙන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

එ. නව ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණයන්හිදී තිරසර ඉදිකිරීම් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කෙරෙනා ආකරයට ඒවා ක්‍රියාත්මක කිරීම.

ඒ. එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක වලට අදාල සෘජු ක්‍රියාමාර්ගයන්

තිරසර සංවර්ධන ඉලක්ක 04-ගුණාත්මක අධ්‍යාපනය

ශ්‍රී ලංකාවේ අතීත පරිසරය ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී නව දැනුම සංවර්ධනය සහ කුසලතා අභිවර්ධනය උදෙසා ඉහල ගුණත්වයකින් යුත් පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනු පිණිස අදාල වන ක්‍රියාමාර්ග කිහිපයක් භාවිතා කර තිබේ.

මෝසම් කාලගුණික වෙනස්කම්, තුරුලතාවන්හී වෙනස්කම්, ආර්ථික භෝග ගෘහස්තකරණය (උදා-වී සහ කෙසෙල්), සහ ඉඩම් භාවිතාකිරීමේ ඉතිහාසය වැනි පාරිසරික පුරාවිද්‍යාවන්හී වැඩ සටහන් සැකසීම සම්බන්ධ ක්ෂේත්‍ර සහ විද්‍යාගාර ක්‍රියාකාරකම් පැවැත්විණි. පාරිසරික පුරාවිද්‍යා වැඩසටහන හා සමගාමීව ගුණාත්මක පශ්චාත් උපාධි අධ්‍යාපනය ශක්තිමත් කරනු පිණිස, චාතුර්තික පර්යේෂණ ජාත්‍යන්තර සංගමය සහ මානව ජෛවගෝලීය කොමිසමේ අධ්‍යයන සහය/ සහයෝගීතාව සහ ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනයේ සහ ඉන්දියවේ ෂර්මා අධ්‍යයන ආයතනයේ පර්යේෂණ සහය ලබාගන්නා ලදී. අතීත මානව -පාරිසරික අන්තර් ක්‍රියාවන් පිළිබඳ බහුවිධ ශික්ෂණ පර්යේෂණයන්

ප්‍රවර්ධනය සහ චාතුර්තික කාලගුණ සහ පාරිසරික වෙනස්කම් සම්බන්ධයෙන් ප්‍රතිචාර අවබෝධකරගැනීම පිණිස චාතුර්තික පර්යේෂණ ජාත්‍යන්තර සංගමය සහ මානව ජෛවගෝලීය කොමිසමේ උප සභාපති ලෙස කටයුතු කිරීමට පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සභික ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක මහතා ජාත්‍යන්තර වශයෙන් තෝරා ගන්නා ලදී. ජාත්‍යන්තර සහයෝගීතාව සහිතව ගත් කළ මෙම තනතුර ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යයනයන් තවත් ශක්තිමත් කිරීමට ලැබුන ඉතා වැදගත් අවස්ථාවක් වේ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමග සෘජු සබඳතා ඇති ස්මාරක සහ වැඩබිම් සඳහා වන ජාත්‍යන්තර සභාව (ICOMOS), සංස්කෘතික දේපල සංරක්ෂණය සහ ප්‍රතිෂ්ඨාපනය පිලිබඳ අධ්‍යයන සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICCROM) වැනි ජාත්‍යන්තර ආයතන සමග කටයුතු කරමින් සහ ඉතා පුළුල් සම්බන්ධතාවන් පරාසයක් සහිත ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥ සංගමය සහ ජාතික භාරය වැනි සංවිධාන සමග එක් වෙමින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී මහතා ආයතනයේ අභිවෘද්ධිය පිණිස කටයුතු කර තිබේ. ජන මාධ්‍ය හරහා ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ පුරාවිද්‍යාව පිලිබඳ දැනුමට අදාලව විවිධ වැඩ සටහන් සකසමින් පුරාවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව කටයුතු කර තිබේ. මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබනා විවිධ වැඩ සටහන් වලට සහභාගි වෙමින් මහාචාර්ය ඩී පී ගම්ලත්, ආචාර්ය ඒ තන්තිලගේ, ආචාර්ය ඩී එම් ආර් ඒ බණ්ඩාර සහ ආචාර්ය එන් පී ආර් නාන්කඳුර පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සංවර්ධනය මෙන්ම ආයතනය ප්‍රවර්ධනය පිණිස සක්‍රීයව දායක වූහ.

තිරසර සංවර්ධන ඉලක්ක 13- දේශගුණ තත්වයන් සම්බන්ධ ක්‍රියාමාර්ග

මානව සංස්කෘතික සංදර්භය මත දේශගුණ විපර්යාසයන්හී අහිතකර බලපෑම මගහැරීම උදෙසා දිගු සහ කෙටි කාලීන දේශගුණික සහ පාරිසරික වෙනස්කම් පිළිබඳ දැනුම තීරණාත්මක වන අතර පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශගුණික විපර්යාසයන් පිලිබඳ ක්‍රියාමාර්ග සම්බන්ධ කටයුතු ශක්තිමත් කරමින් අදාල පර්යේෂණ වැඩ සටහන් වෙත දායකත්වය සපයා තිබේ. දකුණු ආසියානු කලාපයෙහි මෝසම් දේශගුණයෙහි අතීත හැසිරීම අවබෝධ කරගැනීම මූලික වශයෙන්ම මානවයන් හට තිරසරභාවය සහ පූර්ව තත්වයනට යළි එළඹීම සඳහා මාර්ග සිතියමත් සම්පාදනය කරන අතර එහිදී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය කලාපීය ස්වාභාවික දේශගුණික විචල්‍යතාවන් අවබෝධ කරගැනීමේලා විවිධ නියෝජනයන් නිපයමින් පේලියෝ දේශගුණික විද්‍යාවේ සක්‍රීය පර්යේෂණයන්හි නිතර වෙයි.

තිරසර සංවර්ධන ඉලක්ක 15-භූමිය මත ජීවිතය

භෞමික පාරිසරික පද්ධතීන් සුරැකීම පිලිබඳ පර්යේෂණ පැවැත්වීම (උදා- පහත්බිම්හී වැසි වනාන්තර සහ කඳුකර වැසි වනාන්තර), වනාත්තර පාරිසරික පද්ධති වල තිරසර භාවිතය ප්‍රවර්ධනය, කාන්තාරකරණයට අදාල වන සාදක අවබෝධකරගැනීම, ඉඩම් පරිහාණියට ලක් කිරීම නතර කිරීම, ජෛව විවිධත්වය විනාශ කිරීම නතර කිරීම තිරසර සංවර්ධන ඉලක්ක 15 හිදී අවධාරණය කෙරේ. මේ සංදර්භය තුළ, තිරසර සංවර්ධන ඉලක්ක 15 හා සෘජු සබඳතාවක් ඇති රේඩියෝ කාබන් කාල නීර්ණය සහ පරාග විද්‍යාව සහ පොසිල විද්‍යාව යොදාගනිමින් රටෙහි කඳුකර සහ පහත් බිම්හී වනාන්තර පාරිසරික පද්ධති තුළ ඉඩම් භාවිතා කිරීමේ ඉතිහාසයන් සහ තුරු ලතාවන්හී දීර්ඝ කාලීන ප්‍රතිසංස්කරණ සහ අවබෝධකරගැනීම් වෙනුවෙන් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සිදුකෙරේ.

04.7 තිරසරභාවය මත පදනම්ව අනාගත පුරෝකථන වාර්තාව

පවත්නා දැක්මෙහි සීමාවන් තවදුරටත් වර්ධනය කිරීම සහ අනාගත අභියෝගයන් ජය ගැනීම උදෙසා මේ කොටසේදී සැලසුමක් යෝජනා කරනු ලැබේ.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ගුණාත්මක වන්නාවූද නවීන ලෝකයට මනාව ගැලපෙන්නාවූද පරිවර්තනීය සහ නවෝත්පාදී පර්යේෂණ සහ අධ්‍යයන වැඩ සටහන් සැලසුම් කිරීමට උත්සුක වෙයි. යෝජිත සියළු ක්‍රියාකාරකම් ආඥා පණත අනුවම සිදු කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් ගත් කළ, අද අප රට මුහුණ පා සිටිනා අභියෝගයක් වන විද්‍යාත්මක පදනමකින් මානව සමාජ ගතිකයන් අවබෝධ කරගැනීම පුළුල් කිරීම පිණිස වන අතීත දැනුම භාවිතා කිරීම යන කරුණ තීරක සාධකයක් ලෙස හඳුනා ගනු ලැබ තිබේ.

ඒ අනුව පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ නව පශ්චාත් උපාධි වැඩ සටහන් හඳුන්වාදීම මගින් විෂය මාලාව වෙනස්කිරීමට සැලසුම් කර තිබේ. මේ හරහා, මේ ආයතනයෙන් අධ්‍යාපනය ලැබීම පිණිස (ස්වාභාවික විද්‍යා සහ මානවවංශවේදයන්) විවිධ විෂයන්හී දැනුම සහිත උපාධිධාරීන් වඩ වඩා ආකර්ෂණය කරගනු රිසින් විවිධ ප්‍රයත්නයන් දරනු ලැබේ.

සංවර්ධනයන් වේගවත් කිරීම පිණිස විශේෂ උනන්දුවක් දක්වමින් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ යෝජිත සංකල්පයන් සන්නිවේදනය කරනා ලැසිය්තුවක් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සහ අධ්‍යාපන වැඩ සටහනේහි ඇතුලත් වේ.

අ. පර්යේෂණ හා සබැඳි විෂයමාළාවක් සැලසුම් කෙරේ

ආ. බහුවිධ ශික්ෂණයන්ගෙන් සමන්විත් පාඨමාලා ව්‍යුහයක් සැලසුම් කෙරේ

ඇ. පුරාවිද්‍යාවේ සම්ප්‍රදායික මාර්ග සහ නව මාර්ග (පුරාවිද්‍යා විද්‍යාවන්) අතර සමබරතාව පවත්වාගනු ලැබේ

ඈ. දකුණු ආසියාවේ සහ අනෙක් රටවල් හී අනෙක් පර්යේෂණ ආයතන, රජයේ ආයතන, පදනම් සහ අරමුදල් සපයන නියෝජිතායතනයන් සමග පර්යේෂණ මත පදනම් වන හවුල්කාරිත්වයන් පිලිබඳව තදින් ෂලකා බලනු ලැබේ

ඉ. පදනම්/ හෝ රජය මගින් පර්යේෂණ යටිතල පහසුකම් සඳහා සපයනු ලබනා අරමුදල් තදිනක් සලකා බලනු ලැබේ

ඊ. අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘති සහ අපේම අධ්‍යයන කටයුතු මගින් උපයනු ලබනා ආදායම් වර්ධනය කිරීම

උ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන්ගේ සංයුතිය තුළ වන විවිධත්වය වර්ධනය කිරීම (නැගෙනහිර/ යාපන සරසවි වලින් පැමිණෙනා සිසුන් හට අවස්ථාවක් සලසා දීම)

අපට එළඹෙන දශකය තුළ ළංවිය හැකි තත්වය කවරේදැයි යන්න පිළිබඳව නවෝත්පාදී අයුරින් ගවේෂණය කරමින් කලාපීය/ ගෝලීය අභියෝගයන්ට ආමන්ත්‍රණය කරනු පිණිස ඉගැන්වීම් සහ අධීක්ෂණය මගින් අතීත දැනුම සහිත තරුණ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගේ කුසලතා සහ ශක්‍යතාවන් තවදුරටත් වර්ධනය කිරීම

පුරාවිද්‍යාව කෙරේ බහුවිධ ශික්ෂණ ප්‍රවේශයක් සංවර්ධනය කිරීම මගින්, අතීත අසාධාරණයන් නිවැරදි කරනු පිණිස යතුරක් සේ සියළු ආකාර පුරාවිද්‍යා දත්ත පාවිච්චි කිරීමට හැකිවන සේ සැලසුමක් නිර්මාණය කිරීම මගින්, සහ දේශීය සහ ආදි ප්‍රජාවන් බලගන්වමින් සහ සමකාලීන ගැටළුවලට විසඳුම් සම්පාදනය සඳහා උපකාරී වෙමින් පුරාවිද්‍යාව සාර්ථක කරගැනීමට කැපවීම

පුරාවිද්‍යාව,පේලියෝ දේශගුණිකත්වය, පරාග විද්‍යාව, පොසිල විද්‍යාව, පාරිසරික පුරාවිද්‍යාව, සංරක්ෂණය, සමාජ පුරාවිද්‍යාව, ප්‍රාග් ඉතිහාසය, කලා ඉතිහාසය සහ වෙනත් විද්‍යාවන් හී සහයෝගී පර්යේෂණ සහිතව දියුණු වෙමින් පවතින අන්තර් ශික්ෂණ විද්‍යාවට ඇති බාධක ඉවත් කරලීම වෙනුවෙන් අඛණ්ඩව වැඩ කිරීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය දේශීය සහ ජාත්‍යන්තර ප්‍රකාශනයන් නිපදවමින් සහ ප්‍රධාන අධ්‍යාපනික ආයතන සමගින් සම්බන්ධතාවන් තහවුරු කරගනිමින් ආයතනයේ පර්යේෂණ වැඩසටහන් හී ගුණත්වය වර්ධනය කිරීමට සැලසුම් කරයි.

දකුණු ආසියාවේ හොඳම පර්යේෂණ මධ්‍යස්ථාන අතරින් උසස් මට්ටමේ පර්යේෂණයන්, නව්‍යෝත්පාදනයන්,සහ දැනුම නිෂ්පාදනය සහිත විශිෂ්ටතම මධ්‍යස්ථානයක් ලෙස ආයතනය පවත්වා ගැනීම උදෙසා ඉහල බලපෑමක් සහිත ජාත්‍යන්තර ප්‍රකාශනයන් බිහිකිරීම දිරිගැන්වීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (1) ශ්‍රී ලංකාවේ දැනුම මත පදනම් ආර්ථිකයේ සක්‍රීය සාමාජිකයකු බවත් (2) බුද්ධිමය අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කිරීමෙහිලා පුරාවිද්‍යා අධ්‍යයන මධ්‍යස්ථානයක් බවත් (3) මානව සමාජයන්හී දිගු කාලීන ගමන් පථයන් අවබෝධ කරගැනීම පිණිස මධ්‍යස්ථානයක් සේ කටයුතු කිරීමට කැපව සිටින බවත් ඉහත කොටසින් දක්වා සිටියි.

ඉලක්කගත ප්‍රජාවන්

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය අතීතය සහ එහි පුරාවිද්‍යාත්මක වැදගත්කම අවබෝධ කරගැනීමෙහිලා වන ක්‍රමික නව්‍යෝත්පාදන කෙරේ විශේෂයෙන් අවධානය යොමු කිරීම මගින් පුරාවිද්‍යා විද්‍යාවන්, පුරාවිද්‍යාව, සහ පොදු ජනයා අතර ඉහල මට්ටමේ අන්තර් ක්‍රියාකාරීත්වයන් උපරිම කරනා විශේෂ ප්‍රජාවන් ඉලක්ක කිරීමට අවධානය යොමු කරයි.

1. විශ්ව විද්‍යාල ප්‍රජාවන් (කාර්ය මණ්ඩල සාමාජිකයන්) සහ වෙනත් අධ්‍යනාංශ / විශ්වවිද්‍යාලයන්හී පශ්චාත් උපාධි සිසුන්

2. වෘත්තීය ප්‍රජාව (උදා- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කෞතුකාගාර සහ වාරිමාර්ග)

3. ජාත්‍යන්තර ප්‍රජාව (වෙනත් රටවල සිසුන්)

4.පොදු ජනතාව (අ) ආයතනගත (වෙබ්) (ආ) රජයේ නාළිකා (ශ්‍රී ලං ගු වි සං, ස්වාධීන රූපවාහිණී සේවය,ශ්‍රී ලංකා රූපවාහිණී) සහ ජාත්‍යන්තර මාර්ග (අනුමත පර්යේෂණ සම්බන්ධතා) එනම් අපේ පර්යේෂණ නිමැවුම් පොදු ජනයා වෙත ගෙන යන මාර්ග

ආයතනයට නව ආලෝකයක්

සංවර්ධනය කෙරේ වන විශේෂ උනන්දුවක් යෝජනා කෙරේ.

1. පශ්චාත් උපාධි සිසුන් සඳහා ඉතා ඉහල ප්‍රමුඛතාවන්
2. ජාතික/ජාත්‍යන්තර සම්මේලනයන්ට සහභාගි වීමට සහ අරමුදල් සපයන නියෝජිතායතන සහ වෙනත් ආයතන සමගින් පර්යේෂණ අරමුදල් ලබාගැනීම උදෙසා රැස්වීම් සැලසුම් කිරීමට ආයතන සාමාජිකයන් උනන්දු කරනු ලැබේ.
3. දේශීය (උදා-ජාතික විද්‍යා පදනම, සහ ජාතික පර්යේෂණ සභාව) සහ ජාත්‍යන්තර අරමුදල් නියෝජිතායතන (උදා-බ්‍රිටිෂ් ඇකඩමිය සහ පුරාවිද්‍යා උරුමය සහ වෙනත්(සමග තනි තනි හෝ සාමූහික අරමුදල් යෝජනා සංවර්ධනය කිරීමට අධ්‍යයනායතනයේ සාමාජිකයන් දිරිමත් කරනු ලැබේ.
4. අධ්‍යයනායතනයේ පර්යේෂණ වැඩ සටහන් සමග සම්බන්ධ වීමට සිසුනට වටිනා අවස්ථාවක් දෙනු ලැබේ.
5. පුරාවිද්‍යාවේ අන්තර් ශික්ෂණ කලාපයන්හී වැඩ කිරීම සඳහා සිසුන් හට ආශ්‍රිත වැඩසටහන හඳුන්වා දෙනු ලැබේ.
6. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ප්‍රබල පර්යේෂණ හැකියා සහිත විශේෂඥයන් හඳුන්වා දෙනු ලැබේ. උදා-පේලියෝලිමැටලොජී, අධිකරණ වෛද්‍ය විද්‍යාව, අධිකරණ පුරාවිද්‍යාව, පාරිසරික විපර්යාස, ඉඩම් පරිහරණ වෙනස්කම්, ශිලාලිපි, කෞතුකාගාරවේදය, නානකවිද්‍යා සහ පුරාණ තාක්ෂණය, ප්‍රාග් ඓතිහාසික කලා ඉතිහාසය සහ සමාජ පුරාවිද්‍යාව
7. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව සම්බන්ධයෙන් සහයෝගී පර්යේෂණ සිදුකිරීම පිණිස ගෝලීය ආයතනයන් වෙතින් හවුල්කරුවන්හට ඇරයුම් කරනු ලැබේ (ඉහත සඳහන් කර ඇති)
8. අතීතය පිලිබඳව අවබෝධ කරගැනීමේ වැදගත්කම හඳුන්වා දෙමින් සාමාන්‍ය පෙල සහ උසස් පෙල සිසුන් සමග කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇති කරගැනීම (උදා- වැඩකිරීමේ අත්දැකීම, වැඩමුළු සහ ක්ෂේත්‍ර පාරිසරික වැඩසටහන්)
9. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාන සහ පරිපාලන කාර්ය මණ්ඩලය සමග මනාව සංවිධානය කරන ලද අන්තර් සම්බන්ධිත වැඩ සටහන්

හවුල්කාරීත්වයන් පුළුල් කිරීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ කුසලතා පුහුණු ආයතන සමග සහයෝගීතා සම්පාදනය පිණිස ව්‍යුහයක් සංවර්ධනය කිරීම. (උදා- මධ්‍යම සංස්කෘතික අරමුදල, කෞතුකාගාර සහ අමාත්‍යාංශ, කාලගුණ විද්‍යා, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව) පොදු ජනයා වෙත දැනුම ලබාදීම සහ සවිමත් සහයෝගීතාවන් ඇතිකරගැනීමට හැකි නියාමන ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීමට හවුල්කාරීත්වය යටතේ පහසුය.

යටිතල පහසුකම් සංවර්ධනය

පහසුකම් සැලසීම හරහා ආයතනයේ දැනට පවත්නා සිසු පදනම පුළුල් කිරීම දිරිමත් කෙරේ. උදාහරණ වශයෙන්-ශ්‍රව්‍ය ස්ලයිඩ්ස්, අන්තර් ක්‍රියාකාරී සිතියම් කියවන උපකරණ, සිසු ජාලකරණය, තොරතුරු තාක්ෂණය, සිසුන් උදෙසා පර්යේෂණ ද්‍රව්‍ය පුස්තකාලය, ක්ෂේත්‍ර විද්‍යාගාර, පර්යේෂණ විද්‍යාගාර පහසුකම්, පටිගත කිරීමේ ශබ්දාගාරය, ඉගැන්වීම පිණිස පරිගණක සහ ශ්‍රව්‍ය පහසුකම්, අවන්හල සහ ජ්‍යෙෂ්ඨයන්ගේ පොදු කාමරය, සිසුන්ගේ අවන්හල සහ ඡායාපිටපත් සහ පරිලෝකන මධ්‍යස්ථානය

05. සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

අධ්‍යයන පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2022	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2023	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2024 ***	සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය *	සමස්ත පරිපාලන කාර්ය මණ්ඩලය **	සමස්ත අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	32	23	20	07	04	03	12
උරුමයන් පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	31	00				
කලා ඉතිහාසය් පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	0	09	0				
පුරාවිද්‍යා /කලා ඉතිහාසය සහ උරුමය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්)	28	48	53				
පුරාවිද්‍යාවපිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (දේශන/පර්යේෂණ)	09	00	05				
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය (දේශන/පර්යේෂණ)	105	135	111				
පුරාවිද්‍යා/ පිළිබඳ දර්ශන විශාරදඋපාධිය (දේශන/පර්යේෂණ)	14	21	17				
පුරාවිද්‍යා /කලා ඉතිහාසය සහ උරුමය පිලිබඳ දර්ශනශූරී උපාධිය	43	48	46				
කෞතුකාගාරවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	13	10	00				
එකතුව	**244**	**316**	**252**	**07**	**04**	**03**	**12**

සටහන-

*ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, කථිකාචාර්ය (ආධුනික), ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති

** නියෝජ්‍ය ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, සහකාර ලේඛකාධිකාරී , නියෝජ්‍ය මූල්‍යාධිකාරී, සහකාර ලේඛඛාධිකාරී/මූල්‍යාධිකාරී

***මෙම සේවක සංඛ්‍යාව 2018.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුමත කර ඇත.
පසුගිය වසර තුන තුළ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සිසුන් සංඛ්‍යාව සැලකිල්ලට ගෙන ඇත.
(ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 3ක් වන හෙයිනි.)
පුරාවිද්‍යා විද්‍යාපති පාඨමාලාව පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත.

(ඒ මේ පාඨමාලාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)
කලා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් (දේශන සහ පර්යේෂණ) පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාළාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)

පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්) සම්බන්ධයෙන් පසුගිය වසර 4 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාලාවෙහි උපරිම කාලය වසර 4ක් වන හෙයිනි.)

පුරාවිද්‍යාව පිළිබඳ දර්ශන විශාරද උපාධිය සම්බන්ධයෙන් පසුගිය වසර 5 සිසුන් සැලකිල්ලට ගෙන ඇත . (ඒ මේ පාඨමාලාවෙහි උපරිම කාලය වසර 5ක් වන හෙයිනි.)
පුරාවිද්‍යා දර්ශනශූරී උපාධිය සම්බන්ධයෙන් පසුගිය වසර 10 ක සිසුන් සැලකිල්ලට ගෙන ඇත. (මේ පාඨමාලාවෙහි උපරිම කාලය වසර දහයක් වන හෙයිනි.)

5.1 උපාධි නොවන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම

පාඨමාලාව	ශිෂ්‍ය සංඛ්‍යාව 2021	ශිෂ්‍ය සංඛ්‍යාව 2022	ශිෂ්‍ය සංඛ්‍යාව 2023	ශිෂ්‍ය සංඛ්‍යාව 2024
පුරා ජෛව විවිධත්ව ඩිප්ලෝමාව	66	**	32	35
කලා ඉතිහාසයේ සහතික පාඨමාලාව	57	**	20	20
සත්ව පුරාවිද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව	36	**	46	40
පුරාවිද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	11	**	15	
සංස්කෘතික සංචාරක කටයුතු පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	30	**	00	-
පුරාවිද්‍යාව සහ සංස්කෘතික සංචාරක කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	63	**	95	2023 කණ්ඩායම ඉදිරියට
කෙටි කාලීන පාඨමාලා- GIS	***	***	16	-
ශිලා ලේඛණ පිලිබඳ කෙටිකාලීන පාඨමාලාව	***	***	24	-
තල් පත් සහ අත්පිටපත් පිලිබඳ කෙටිකාලීන පාඨමාලාව	***	***	****	15
සංස්කෘත භාෂාව පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව	***	***	****	19
එකතුව	**263**		**248**	**109**

* කෝවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2020 වසරට අදාල ඇතැම් පාඨමාලා තවමත් පවත්වාගෙන යනු ලබන අතර අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලිය 2022 අප්‍රියෙල් මස ආරම්භ වනු ඇත.

** 2021 සහ 2022 වසර වලදී සම්පූර්ණ කළ යුතුව තිබූ අනිවාර්යය ක්ෂේත්‍ර කාර්යයන් හේතුවෙන් ඇතැම් පාඨමාලා 2022 වසර තුළදීත් පැවැත්වෙන අතර නව කණ්ඩායම් 2023 පෙබරවාරි සිට ඉදිරියට ආරම්භ කෙරේ.

*** 2023 වසරේදී හඳුන්වා දෙන ලදී.
**** 2024 වසරේදී හඳුන්වා දෙන ලදී

06. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

පාඨමාලාව	2024	1 වන වසර සිසුන්	2 වන වසර සිසුන්	3 වන වසර සිසුන්	4 වන වසර සිසුන්
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	20	20	-	-	-
උරුමය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	00	00			
කලා ඉතිහාසය පිළිබඳ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	05	05	-	-	-
පුරාවිද්‍යා/කලා ඉතිහාසය/උරුමය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (දේශන / පර්යේෂණ මගින්)	10	10	18	04	12
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය (දේශන/පර්යේෂණ)	08	08	20	12	27
පුරාවිද්‍යාව/කලා ඉතිහාසය/උරුමය පිළිබඳ දර්ශන විශාරදඋපාධිය	02	02	04	03	02
පුරාවිද්‍යා/කලා ඉතිහාසය/උරුම පිළිබඳ දර්ශනශූරී උපාධිය	03	03	07	06	03
එකතුව	**48**	**48**	**49**	**25**	**44**

06.1 උපාධිය ලබනා සිසුන් පිලිබඳ විස්තර

පාඨමාලාව	වසර 2021	වසර 2022	වසර 2023	වසර 2024
පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	21	19	30	20
කලා ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	02	09	-
උරුමය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	-	-	14
කෞතුකාගාර අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	-	-	11	-
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ මගින්)	06	06	02	04
පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය (පර්යේෂණ/දේශන මගින්)	-	-	-	
පුරාවිද්‍යා විද්‍යාපති උපාධිය(දේශන/පර්යේෂණ)	08	13	08	11
පුරාවිද්‍යාව පිළිබඳ දර්ශන විශාරද උපාධිය	03	02	02	05
පුරාවිද්‍යා දර්ශනශූරී උපාධිය	01	02	07	02
එකතුව	**39**	**44**	**69**	**56**

07. කාර්ය මණ්ඩල තොරතුරු

07.01. ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩලය

සේවා ගණය	වැටුප් කේතය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
අධ්‍යක්ෂක	U-AC 5(II/I)	01	*07	04
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5	10		
සහාය මාහාචාර්ය	U-AC 4			
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කථිකාචාර්ය කථිකාචාර්ය (ආධුනික)	U-AC 3			
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති	U-AC 3	01	01	-
නියෝජ්‍ය ලේඛකාධිකාරී	U-EX 2 (I)	01	-	01
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	U-EX 2 (II)	01	01	-
නියෝජ්‍ය මූල්‍යාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	U-EX 2(I)	01	01	-
සහකාර ලේඛකාධිකාරී	U-EX 1(III)	01	01	-
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	U-EX 1(III)	01	**01	-
එකතුව		**17**	**12**	**05**

* ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු අධ්‍යක්ෂ ලෙස පත් කර ඇත.

** වර්තමාන සහකාර මූල්‍යාධිකාරී වාර්ෂික කාර්ය සාධන වාර්තාව මත ජ්‍යෙෂ්ඨ සහතාර මූල්‍යාධිකාරී තනතුරට උසස් කරන ලදින් එසේ සහතාර මූල්‍යාධිකාරී උත්ශ්‍රේණිගත කර ඇත

07.02 තෘතීය මට්ටමේ කාර්ය මණ්ඩලය

සේවා ගණය	වැටුප් කේතය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
විද්‍යාත්මක සහකාර	U-AS 2(II/I)	03	03	-
වැඩ සටහන් ක්‍රියාකරු/පද්ධති විශ්ලේෂක	U-AS2(II/I)	01	-	01
එකතුව		**04**	**03**	**01**

07.03 ද්විතික මට්ටමේ කාර්ය මණ්ඩල විස්තර

සේවා ගණය	වැටුප් කේතය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
කාර්මික නිලධාරී	U-MT 1(III/II/I)	01	01	-
කාර්මික නිලධාරී (සිවිල්)	U-MT 1(III/II/I)	01	-	01
කළමනාකරණ සහකාර	U-MN 1(III/II/I)	09	* 05	04
කළමනාකරණ සහකාර (පොත් තැබීම)	U-MN 1(III/II/I)	01	01	-
පුස්තකාල තොරතුරු සහකාර	U-MN 1(III/II/I)	03	02	01
එකතුව		**15**	**09**	**06**

සටහන- පෙර පැවති සේවක සංඛ්‍යාව අනුව 2014.10.24 දින සිට දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිලධාරී තනතුරෙහි සේවකයකු සේවයෙහි යෙදී සිටී. එනමුදු කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් 2017 දී අනමත කරන ලද සේවක සංඛ්‍යාව තුළ මේ තනතුර සඳහන්ව නැත වර්තමානයේදී මේ සේවකයා අධ්‍යයන අංශයේ කළමනාකරන සහකාර තනතුරක රාජකාරී ආවරණය කරයි

07.04 ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩල විස්තර

සේවා ගණය	වැටුප් කේතය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
රියදුරු	U-PL 3(III/II/I/Spl)	02	01	01
රසායනාගාර සහායක	U-PL 2(III/II/I/Spl)	01	01	-
වැඩ සහායක	U-PL 1(III/II/I/Spl)	03	-	03
එකතුව		**06**	**02**	**04**

08. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහවැඩමුළු පිළිබඳ විස්තර (කාර්ය මණ්ඩල සහභාගීත්වය)

විෂය	සහභාගි වූ සංඛ්‍යාව	සම්පූර්ණ කළ
පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	10	10
ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව	6	6
සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව	4	4
වෙනත් (උදා: සම්මන්ත්‍රණය / වැඩමුළුව/ ක්ෂේත්‍ර චාරිකා)	21	21
එකතුව	**41**	**41**

09. ලැබුණු සම්මාන පිලිබඳ විස්තර

විෂය	සම්මාන සංඛ්‍යාව	ශාස්ත්‍රඥයන් සංඛ්‍යාව
දේශීය සම්මාන	0	0
ජාතික මට්ටමේ සම්මාන	1	1
ජාත්‍යන්තර සම්මාන	4	1
වෙනත්	5	3
එකතුව	**10**	**5**

10. රැස්වීම් පිලිබඳ විස්තර

රැස්වීම	2024 වසර තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
කළමණාකරන මණ්ඩල	07
විගණන සහ කළමණාකරන කමිටු	02
මූල්‍ය කමිටුව	01
පුස්තකාල උපදේශන කමිටුව	01
අධ්‍යයන මණ්ඩල	05
එකතුව	**16**

11. පර්යේෂණ ව්‍යාපෘති

(අ) පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පර්යේෂකයන් විසින් සිදුකරන ලද පර්යේෂණ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

පර්යේෂණ වැඩසටහනේ නම	අරමුදල්	පර්යේෂණයේ කෙටි විස්තරයක්
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව		
හොලෝසීන යුගයේ මෙසොලිතික දඩයක්කාර කණ්ඩායම් හී සංක්‍රමණය	මෙල්බෝර්න් හී පර්යේෂණ-උරුම සහයෝගීතාව	මීමුරේ පුරාණ සොහොන් බිමක කැණීමක් සිදු කරන ලදී අයර්ලන්ඩ් හී ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලය විසින් දින නියම කර ලදී
ප්‍රාග් ඓතිහාසික ගුහා කැටයම් පිලිබඳ අධ්‍යයනය	මෙල්බෝර්න් හී පර්යේෂණ-උරුම සහයෝගීතාව	අරලගංවිල දානිගලින් වාර්තා වූ විස්තීර්ණ ගුහා කැටයම් ලේඛණයක් පිටපත් කිරීම
මහාචාර්ය ඩී පී ගමලත්		
වත්තේගම ස්ථූප කැණීම් සහ පර්යේෂණ වැඩසටහන	පරිත්‍යාග	වැඩ බිමෙන් හමුවූ ප්‍රසිද්ධ නොකරන ලද ලේඛණ 6ක් දැන් සම්පූර්ණ කරමින් ඇති අතර වැඩ බිමේ අනෙක් ගවේෂණ කටයුතු සම්පූර්ණ කර ඇත.
බෞද්ධ ආරාම වර්ගීකරණ පර්යේෂණය	ස්වයං මූලනය මගින්	සිදු කෙරීගෙන යන ව්‍යාපෘතියකි
සේරුවාවිල කැණීම සහ වාර්තාව පුරාවිද්‍ය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	පරිත්‍යාග	සේරුවාවිල කැණීම සහ වාර්තාව පුරාවිද්‍ය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී
ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක		
1.සීඝ්‍ර ආර්ථික සංවර්ධනය හමුවේ සමාජ-පාරිසරික ගතිකයන් නිරීක්ෂණ දිග ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සහ වෙරළබඩ වෙනස්කම් (SEDRIC ව්‍යාපෘතිය) පසුගිය වසර සිට අඛණ්ඩව කෙරීගෙන යන ව්‍යාපෘතියකි	ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක ජාත්‍යන්තර චාතුර්ථක සංගමයේ -මානව ජෛවගෝලීය කොමිසම(HABCOM),උප සභාපතිවරයා වන අතරම කොළඹ ප්‍රංශ තානාපති කාර්යාලය යටතේ ප්‍රංශ-ඉන්දු- ශ්‍රී ලංකා සෘජු අරමුදල් මගින් සහ ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනයේ සහයෝගය මත ක්‍රියාත්මක HABCOM සහ SEDRIC ව්‍යාපෘතීන්හි කටයුතු කරනා ප්‍රධාන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙක් වේ. එහිදී මම SEDRIC ව්‍යාපෘතිය හරහා මායටතේ පු වි ප උ ආයතනයෙහි පර්යේෂණ උපාධි පිණිස ලියාපදිංචි වන සිසුන් හට ප්‍රතිලා හ සැලසීමට පර්යේෂණ	1.පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. මේ වනාහී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාපිත කරන ලද පර්යේෂණයන් සමග සෘජුවම සම්බන්ධිත (පේලියෝ පාරිසරික සහ පාරිසරික පුරාවිද්‍යාව) ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතීන් වේ. SEDRIC ව්‍යාපෘතිය සැලසුම් කරන ලද්දේ දකුණු ආසියාවේ සමාජ, පාරිසරික, ආර්ථික සහ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් සමග සම්බන්ධව වර්තමානයේ වැඩ කරනා ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂකයන් සවිමත් කරනු පිණිසය. ව්‍යාපෘතිය දේශීය ධාරිතා සංවර්ධනය, විද්‍යාපති සිසුන් පුහුණුව , පේලියෝ පාරිසරික විද්‍යාව, දේශගුණික වෙනස්කම්, සහ දකුණු ආසියාවේ පරිසරය කෙරේ පේලියෝ- මානව බලපෑම් සංදර්භයන්හී කුසලතා සංවර්ධනය සහ දැනුම් හුවමාරුව සම්බන්ධ කාර්යයන්ට උපකාර වී තිබේ. ඉන්දු-පැසිපික් කලාපයේ විද්‍යාත්මක හවුල්කාරිත්වය සවිමත් කරමින් 'නිල් ආර්ථික' සංවර්ධන ප්‍රතිපත්තිය සමග ව්‍යාපෘතිය සම්බන්ධ වේ.

	කණ්ඩාර්ය මණ්ඩලය සමග සහයෝගයෙන් වැඩ කළෙමි https://www.ifpindia.org/projects/social-ecological-dynamics-in-rapid-economic-development-infrastructure-and-coastal-change-in-south-eastern-sri-lanka/	
2.**MANDU**ව්‍යාපෘතිය ආසියාවේ භූමි දර්ශණ සහ ජල දර්ශන. මධ්‍යකාලීන දකුණු ආසියාවේ මෝසම් දේශගුණික විෂමතා, සහ සමාජ ගතිකයන්. මෙය ශ්‍රී ලංකාවද ඇතුළුව රටවල් 10 ක විශේෂඥයන් සමගින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර ව්‍යාපෘතියකි. පසුගිය වසර සිට අඛණ්ඩව කෙරීගෙන යන ව්‍යාපෘතියකි	ආචාර්ය ආර් ටී ප්‍රේමතිලක යනු පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය/ පරාග සහ පොසිල විද්‍යා විද්‍යාගාරය/ සමාජ විද්‍යා අධ්‍යනාංශය, /ඉන්දියා හී IFP ආයතනය සහ ප්‍රංශයේ විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ජාතික ආයතනය (CNRS) අතර වන සෘජු සහයෝගයෙන් ක්‍රියාත්මක වන **MANDU** ව්‍යාපෘතියේ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයෙකි.	පසුගිය වසර සිට අඛණ්ඩව කෙරීගෙන යන ව්‍යාපෘතියකි. ඉන්දියා සහ ශ්‍රී ලංකාවේ මෝසම් වැසි වතමාන ලෝක ජනගහනයෙන් හතරෙන් එකකට කේන්ද්‍රීය වේ. එසේම එය ඉතා බලවත් පාරිසරිස කසහ සමාජ බලපෑම් සහිතයි උප මහාද්වීපයේ කෘෂිකාමික නිමවුම සහ ආහාර ආක්ෂණය වෂාව කාලීනව ලැබීම සහ ප්‍රමාණවත් අයුරින් වෂාව ලැබීම මත විශාල වශයෙන් රඳා පවතී. මේ ව්‍යාපෘතිය අරමුණු කරනුයේ දකුණු ආසියාවේ සංස්කෘතික දියුණුව උදෙසා මෝසම් වැස්සේ බලපෑම වටහා ගැනීමටය. https://www.ifpindia.org/projects/landscapes-and-waterscapes-in-asia-monsoon-climatic-anomalies-and-societal-dynamics-in-medieval-india
3.පේලියෝ නිවාස පේලියෝලිතික මිනිස් සහ ජනාවාස-අප්‍රිකාවෙන් බැහැරව දකුණු ආසියාව දක්වා-මේ වනාහී ඉන්දියාව ශ්‍රී ලංකාව, ප්‍රංශය සහ පෘතුගාලය යන රටවල විශේෂඥයන් ගේ සහභාගීත්වයෙන් දකුණු ඉන්දියාවේහි ක්‍රියාත්මක ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතියකි.	ආචාර්ය ආර් ටී ප්‍රේමතිලක ව්‍යාපෘතියෙහි ජාත්‍යන්තර පර්යේෂකයෙක් ලෙස නියෝජනය කරයි. පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය/ පරාග සහ පොසිල විද්‍යාව පිළිබඳ විද්‍යාගාරය/ ඉන්දියාව සහ ඉන්දියාවේ ශර්මා මධ්‍යස්ථානය අතර සෘජු සහයෝගයෙන් ක්‍රියාත්මක වන්නකි. මෑතකදී INQUA විධායක කමිටුව 2024 වසර සඳහා INQUA අරමුදල් පිණිස ඉදිරිපත් කරන ලද යෝජනාවන් සලකා බැලීම පිණිස INQUA කොමිසමේ සභාපතිවරුන් හමුවිණි.	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. කමිටුව ව්‍යාපෘති යෝජනාව සඳහා ඉල්ලා ඇති අරමුඅදල් අනුමත කර ඇත. ව්‍යාපෘතිය මගින් දකුණු දිග දකුණු ආසියාවේ පූර්ව ඓතිහාසික සහ පරිසරය අවබෝධ කරගැනීම ඉලක්ක කරයි.. ඉන්දියාව සහ ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි සිසුන් ගේ (2) සහභාගීත්වයෙන් ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණයන් කරගෙන යනු ලබනා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පසුගිය වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අතරට ශාඛ ශෛල, පරාග, ක්ෂුද්‍ර පොසිල අවබෝධ කරගැනීම සහ ප්ලයිස්ටොසීන පූර්ව ඓතිහාසික වැඩබිම (ATM වැඩබිම සහ දකුණු ඉන්දියාවේ සන්ද්‍රයාන්පලය (SEN) වැඩබිමෙහි කැණීම් සම්බන්ධයෙන් ඇතිවන පේලියෝ පාරිසරික ක්‍රමවේදී සීමාවන් අතික්‍රමණය කිරීම ඇතුලත් වේ. http://www.sharmaheritage.com/projects/attirampakkam
4.**ෆා හියන් ව්‍යාපෘතිය** -: ශ්‍රී ලංකාවේ සහල් සහ කෙසෙල් වගාවේ ප්‍රාග් ඓතිහාසික කතා විමර්ශනය කිරීම. පසුගිය වසර සිට අඛණ්ඩව කෙරීගෙන යන ව්‍යාපෘතියකි	**SEDRIC** ව්‍යාපෘතිය ෆා හියන් ව්‍යාපෘතිය උදෙසා රේඩියෝ කාබන් මගින් දින වකවානු තීරණය කිරීම සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සපයයි.	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. රේඩියෝ කාබන් මගින් දින වකවානු තීරණය කරනු ලබනා බහුවිධ ප්‍රවේශයක් මගින් ප්‍රාග් ඉතිහාසය ඉතිහාසයලසහ ආර්ථික ශාඛ සම්පත් කළමනාකරනය පිලිබඳ අවබෝධයක් ලබාගැනීමට ව්‍යාපෘතියෙන් ඉලක්ක කෙරේ. සිය විද්‍යාපති පර්යේෂණ වැඩසටහන සමගින් විද්‍යාපති උපාධි අපේක්ෂකයන් හට මෙහිදී පහසුකම් සලසන ලදී
5. මීගමු බුන්දල- හම්බන්තොට සහ මඩකලපු කලපුවේ පශ්චාත් මධ්‍ය හොලසීන පාරිසරික වෙනස්වීම්	රේඩියෝ කාබන් මගින් දින වකවානු තීරණය කිරීම පිණිස **SEDRIC** ව්‍යාපෘතිය අරමුදල් සපයයි	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. මේ ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ නිරිතදිග සහ නැගෙනහිර වෙරළබඩ පාරිසරික වෙනස්කම් සහ ප්‍රාග් ඉතිහාසය අවබෝධ කරගැනීමට අපේක්ෂා කෙරේ
6.සිංහරාජ වනාන්තරයේ පාරිසරික උරුමය- අතීතය අවබෝධ කරගැනීම උදෙසා වන පරාග විද්‍යාත්මක ප්‍රවේශය. මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ නවීන පරාග පුස්තකාලය සංවධනය කිරීමට අවධානය යොමු කරයි	IFP සහ **SEDRIC** ව්‍යාපෘතියේ පර්යේෂණ සහය සහ උපකාර මෙයට ලැබිණි .	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. සිංහරාජයේ ආවේනික තුරු ලතාවන්හී පරාග අධ්‍යයනය පිළිබඳ නව අංශයකි. පරාග පර්යේෂණ හරහා සිංහරාජ වනපෙතෙහි උරුමය පරීක්ෂාවට ලක්කිරීම මේ ව්‍යාපෘතිය මගින් ඉලක්ක කෙරේ.

7.ශ්‍රී ලංකාවේ යාපන අර්ධද්වීපයේ ඇති අවසාධිත අංශු සම්බන්ධයෙන් බහුවිධ ක්‍රමවේදයන් භාවිතා කිරීමට ඇති හැකියාව අවබෝධ කරගැනීම.	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (ආචාර්ය නිමල් පෙරේරා) සහ ඔහුගේ කණ්ඩායමෙන් ලද සහයෙන් ආරම්භයේදී මේ ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදී.	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. මේ ව්‍යාපෘතිය මගින් යාපන අර්ධද්වීපයේ ප්‍රාග් ඓතිහාසික වැඩබිම් දෙකක පුරා පාරිසරික තත්වයන් විමර්ෂණය කිරීමට ඉලක්ක කෙරේ. මේ ව්‍යාපෘතිය මගින් එක් විද්‍යාපති උපාධි අපේක්ෂකයකු පුහුණු කිරීමට පහසුකම් සැලසේ
8.කන්දරෝඩය පුරාවිද්‍යා ව්‍යාපෘතිය	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (ආචාර්ය නිමල් පෙරේරා) සහ ඔහුගේ කණ්ඩායමෙන් ලද සහයෙන් ආරම්භයේදී මේ ව්‍යාපෘතිය ස්ථාපිත කරන ලදී.	පසුගිය වසරේ සිට කෙරීගෙන යන ව්‍යාපෘතියකි. මේ ව්‍යාපෘතිය මගින් යාපනය කන්දරෝඩයෙ කැණීම් වලින් ලබාගන්නා ලද පෞරාණික රොන්මඩ සැකසුම අවබෝධ කරගැනීමට ඉලක්ක කෙරේ.
9. NASA Project	නව ව්‍යාපෘතියක් උදෙසා වන මූලික සංවිධන ක්‍රියාකාරකම්හී පළමු අදියර එක්සත් ජනපදයේ නාසා ආයතනයේ විද්‍යාඥ කණ්ඩායමක් හා සහයෝගයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.	ශ්‍රී ලංකාවේ පොලොන්නරුව ප්‍රදේශයට ඇද වැටුණ වෙනත් ග්‍රහ වස්තූන්ගේ පොසිල පරාග අන්තර්ගතය තුළින් පිට සක්වල ජීවිතයෙහි සම්භවය අවබෝධ කරගැනීම
ආචාර්ය ප්‍රසන්න රණබාහු		
ගිරිබාව සහ ප්‍රත්‍යන්ත පෙදෙස්හී පුරාවිද්‍යා ගවේෂණ	ACTA සංවිධනය	පර්යේෂණය මගින් ගිරිබාව සහ අවට පෙදෙස්හී ප්‍රාථමික කැණීම් කෙරෙ අවධානය යොමු කරනු ලැබේ.
19 වන සහ 20 වන සියවස්හී ශ්‍රී ලංකාවේ දක්ෂිණ සහ බස්නාහිර පලාතහී බෞද්ධ සිතුවම්	**ප්‍රදාන**	මේ පර්යේෂණය මගින් 19 වන සහ 20 වන සියවස්හී ශ්‍රී ලංකාවේ දක්ෂිණ සහ බස්නාහිර පලාතහී බෞද්ධ සිතුවම් සම්බන්ධයෙන් මූලික ගවේෂණයක් කෙරේ අවධානය යොමු කරයි
ආචාර්ය ඩී.එම්.ආර්.ඒ. බණ්ඩාර මයා		
ගිරිබාව පබළුගල වීදුරු නිෂ්පාදන වැඩබිමේ කැණීම් ව්‍යාපෘතිය	සිචුවාන් විශ්ව විද්‍යාලය චීනය	පබළුගල වැඩබිමෙන් වීදුරු තැනීමේ තාක්ෂණයේ ඉතිහාසය සම්බන්ධයෙන් පමණක් නොව දකු ණු ආසියාවේ වෙළඳ සහ සංස්කෘතික හුවමාරු සම්බන්ධයෙන්ද අනාවරණය කරගත් වැදගත්වන ප්‍රතික්ෂේප කළ නොහැකි අද්විතීය තොරතුරු ඉදිරිපත් කරනු ලබයි
ඉබ්බන්කටුව පශ්චාත් කැණීම් විශ්ලේෂණ වැඩසටහන	මධ්‍යම සංස්කෘතික අරමුදල	තවදුරටත් කරන ලද කැණීම් මගින් මධ්‍යම සංස්කෘතික අරමුදලේ තරුණ නිලධාරීන් හට ක්ෂේත්‍ර පුරාවිද්‍යාව භාවිතය සහ ක්‍රමවේද පිලිබඳව මෙන්ම ප්‍රාග් ඓතිහාසික අවමංගල්‍ය චාරිත්‍ර ගැන තොරතුරු ලබාදීම සහ වැඩි දුර පුහුණුව ලබා දෙයි.
රණව කන්ද පුරාවිද්‍යා සමීක්ෂණ ව්‍යාපෘතිය	මධ්‍යම සංස්කෘතික අරමුදල	උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරාවිද්‍යා ක්ෂේත්‍ර සමීක්ෂණ වැඩ සටහනේ දිගුවකි.
පින්වැව ගල් සොහොන් කනත්ත කැණීම සහ ක්ෂේත්‍ර පාසල	මධ්‍යම සංස්කෘතික අරමුදල	ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව අධ්‍යයනය කරනා පාසල් සිසුන් සහ සරසවි විද්‍යාර්ථීන් හට ප්‍රායෝගික දැනුම සහ පුහුණුව ලබාදීම පිණිස කැණීම ආරම්භ කරන ලදී

ආ). පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සංවිධානය කරන ලද විවිධ වැඩමුළු සහ ක්ෂේත්‍ර චාරිකා

වැඩමුළු

වැඩමුළුවේ නම	කාලය	සම්පත් පුද්ගලයන්	සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී			
කුරුන්දි විහාරයේ සංරක්ෂණ කටයුතු පිලිබඳ වැඩමුළුව	23/01/ 2024		
ලෝක උරුම වැඩබිම් ලැයිස්තුව පිලිබඳ වැඩමුලුව	26-29/01/2024		මධ්‍යම සංස්කෘතික අරමුදල
ඡායාරූපකරණය පිලිබඳ වැඩමුළුව	25-26/10/2024		ICOMOS, පූ වි ප උ ආයතනය
සංස්කෘත භාෂාව පිලිබඳ වැඩමුළුව	22-25/11/2024		විශ්ව විද්‍යාල සිසුන්
සීගිරිය සිතියම්ගත කිරීම සහ ඩ්‍රෝන තාක්ෂණය පිලිබඳ වැඩමුළුව	22/12/2024		GIS ඒකකය

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඩී ආර් කේ සෝමදේව			
කරන ලද ඉල්ලීම පරිදි වයඹ පලාතේ රජයේ නිලධාරීන් උදෙසා පවත්වන ලද එක් දින වැඩමුළුව	දින එකකි	රාජ් සෝමදේව	වයඹ පලාතේ රජයේ නිලධාරීන්, පලාත් ආණ්ඩුකාර
අධිකරණ වෛද්‍ය විමර්ශන පිළිබඳ ධාරිතාව වධනය කරනු පිණිස අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩමුළුවට දායකත්වය සැපයීම	දින 03	රාජ් සෝමදේව සහ ආචාර්ය සුනිල් හේවගේ (MBBS, MD) ආචාර්ය අජිත් තෙන්නකෝන් (MBBS, MD)	පොලිස් නිලධාරීන්, නීතීඥයන්, සහ OMP කාර්ය මණ්ඩලය
ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක			
1. ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනයේ කාර්ය මණ්ඩලය සමග රැස්වීම	ඔක්තෝබ 02-03	SEDRIC ව්‍යාපෘතිය/ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය/ඉන්දියාවේ උරුම අධ්‍යාපනය පිළිබඳ පිළිබඳ ෂර්මා ආයතනය	විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන්
2. ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය පරාග විද්‍යාව සහ ක්ෂුද්‍ර පිටපත් පිළිබඳ විද්‍යාගාර පුහුණුව	අගෝස්තු 5	SEDRIC ව්‍යාපෘතිය	විශ්ව විද්‍යාල ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන්
3. INQUA-HABCOM-විධායක නිලධාරීන් සහ ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති පවත්වන්නන් සමග රැස්වීම් 4	2024 මැයි සිට සැප්තැම්බර් දත්වා	INQUA-HABCOM කාර්ය මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ ජාත්‍යන්තර පර්යේෂකයන් /ඉන්දීය, ඇමරිකා එක්සත් ජනපදු ප්‍රංශ / එක්සත් රාජධානියේ සහ තවත් සාමාජික රටවල් කිහිපයක පරිපාලකයන්
4. ප්‍රංශයේ ජාතික පර්යේෂණ මධ්‍යස්ථානය සහ ඉන්දියාවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය යන ආයතන දෙක මගින්ම සංවිධානය කරන ලද MANDU ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර පර්යේෂණ වැඩසටහන පිළිබඳ මාර්ගගත රැස්වීම සහ සාකච්ඡාව	ජූනි 05	MANDU කණ්ඩායම	ජ්‍යෙෂ්ඨ ජාත්‍යන්තර පර්යේෂකයන් /ඉන්දීය, ඇමරිකා එක්සත් ජනපදු ප්‍රංශ / එක්සත් රාජධානියේ සහ තවත් සාමාජික රටවල් කිහිපයක පරිපාලකයන්
5. පේලියෝ හෝම් මාර්ගගත සංවාදය-දකුණු ආසියාවේ ප්‍රාග් ඓතිහාසික වැඩබිම් හී Phytoliths Taphonomy සම්බන්ධයෙන් ඇති අභියෝග අවබෝධ කරගැනීම	ජූලි 07	ෂර්මා අධ්‍යාපන ආයතනය ඉන්දියාව	ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන් සහ දකුණු ආසියාවේ පරිපාලකයන් සහ පශ්චාත් උපාධි සිසුන්
6. දේශගුණික විපර්යාස පිළිබඳ හේතු සහ බලපෑම් ආමන්ත්‍රණය කරමින් දේශගුණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී මපිලිබඳ තරුණ විද්‍යාඥයන් විසින් සංවිධානය කරන ලද හමුවේ ආරාධිත දේශනය පැවැත්වීම	දෙසැම්බ 10-12	ඉන්දියාවේ බෙංගලාරුහී උසස් විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ජවහර්ලාල් නේරු මධ්‍යස්ථානයේ (JNCASR), TWAS මධ්‍යම සහ දකුණු ආසියානු කලාපීය හවුල්කාර (TWAS-CASAREP) සහයෝගීතාව මත ඉන්දීය විද්‍යා ආයතනය,දේශගුණික විපර්යාස පිළිබඳ දිවේචා මධ්‍යස්ථානය මගින් රැස්වීම සංවිධානය කරන ලදී	දකුණු ආසියාවේ විද්‍යා පසුබිමක් සහිත විවිධ අධ්‍යයන ආයතන සහ විශ්ව විද්‍යාල නියෝජනය කරන අයුරින් දකුණු සහ මධ්‍යම ආසියානු රටවල වයස අවුරුදු 45ට අඩු ආධුනික විද්‍යාඥයන් ඉලක්ක කර රැස්වීම සංවිධානය කරන ලදී. මේ වේදිකාව පර්යේෂකයන් හට තීරණාත්මක දේශගුණික විපර්යාසයන් පිලිබඳව සාකච්ඡා කරන්නට සහ නිරත වන්නට ඉඩ විවර කරන ලදී. තවද එය ආධුනික විද්‍යාඥයන් හට සහ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනා වෘත්තිකයන්ට දේශගුණය, පාරිසරික පද්ධති, සහ මානව සමාජයන් අතර සංකීර්ණ සම්බන්ධතාවන් පිලිබඳව ඔලකා බලන්නට ඉඩකඩ සලසන ලදී. විවිධ කලාපයන්හී මෝසම් රටාවන්හි විවිධත්වය, භූමි ව්‍යුහය, කෘෂිකර්මාන්තය,ජෛව විවිධත්වය,පාරිසරික පද්ධති, මානව සෞඛ්‍යය, සහ ආපදා සහ දේශගුණික බලපෑමෙන් හටගන්නා තත්වයන් කෙරෙ සමාජ ප්‍රතිචාර ඒවාගේ පශ්චාත් බලපෑම් මෙහි ප්‍රධාන කරුණු විය. මෙහිදී කථිකයෝ ගෝලීය මෙන්ම කලාපීය කාලගුණික රටාවන් හැඩගැස්වීමේ ලා සමුදුරු ඩිපොල්ස්, එල් නිනෝ සහ ලා නිනා ඇතුළුව දේශගුණික වෙනස්කම් හී ප්‍රධාන ගාමක බලයන් පිලිබඳව අදහස් පල කළෝය. මේ වැදගත් හේතු පිලිබඳව ආමන්ත්‍රණය කිරීම මගින් ඉන් අදහස් කරන ලද්දේ දේශගුණික තත්වයන්හී බලපෑම් අවම කිරීම සැලසුම් යොදාගනිමින් ඔරොත්තු දීමේ

			හැකියාව වධනය කිරීම සහ නවෝත්පාදක පිළියම් උදෙසා වන සහයෝගී උපාය මාර්ගයන් ආදේශ කරගැනීමය.
ආචාර්ය අර්ජුන තන්තිලගේ			
LiDAR පිළිබඳ වැඩමුළුව	දින 02	ඔව්	පුරාවිද්‍යාඥයන්
ආචාර්ය එන් පී ආර් නාන්කඳුර			
19වන සියවසේ දක්ෂිණ ශ්‍රී ලංකාවෙහි බෞද්ධ සිතුවම්	දින 02	02	15
19 සියවසේ සහ 20 වන සියවසේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ දක්ෂිණ සහ බස්නාහිර පලාත්හී බෞද්ධ සිතුවම්	දින 01	02	15
ගිරිබාව සහ ආසන්න පෙදෙස්හී පුරාවිද්‍යාත්මක ගවේෂණ	දින 02	04	20
ආචාර්ය ඩී එම් ආර් ඒ බණ්ඩාර			
ඉබ්බන්කටුව පශ්චාත් කැණීම් විශ්ලේෂණ වැඩ සටහන	සති 0	මේනකා ප්‍රනාන්දු මෙය, සංරක්ෂණ නිලධාරී, මධ්‍යම සංස්කෘතික අරමුදල	IBB2023 කැණීම් කණ්ඩායමේ සාමාජිකයන්
මානව අස්ථි විශ්ලේෂණය	දින 01	මහාචාර්ය චන්දිමාල් සහ වයඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙක්	පු වි ප උ ආයතනයේ පුරාවිද්‍යා විද්‍යාපති උපාධි අධ්‍යයන 2022/23 කණ්ඩායම

ක්ෂේත්‍ර චාරිකා

ක්ෂේත්‍ර චාරිකාවේ අරමුණ/ අරමුණු	**කාලය / දින**	**සහභාගිවූවන්/ඉලක්ක කණ්ඩායම**
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී		
රත්නපුර කෞතුකාගාරය හරහා පාෂාණ විද්‍යාව පිළිබඳ සංචාරක උනන්දුව ප්‍රවර්ධනය කිරීම	2024/04/01	ජෛව විවිධත්වය පිළිබඳ උපදේශක කමිටුව
බුන්දල ජාතික උද්‍යානය	2024/04/02	ජෛව විවිධත්වය පිළිබඳ උපදේශක කමිටුව
කිතුල්ගල	2024/04/10	ජෛව විවිධත්වය පිළිබඳ උපදේශක කමිටුව
උලවල පොත්ගුල් ලෙන වැඩබිම් කැණීම්	2024/06/03	මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පු වි ප උ ආයතනය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව		
දානිගල ශිලා ලේඛණ පිටපත් කිරීම	දින 06	පශ්චාත් උපාධි සිසුන් සහ ස්වේච්ඡා කණ්ඩායම්
මීමුරේ කැණීමක් සිදු කිරීම	දින 30	උපාධි අපේක්ෂකයන්
ඹුලතිවු හි කැණීමක් සිදු කිරීම		
ආචාර්ය ටී ආර් ප්‍රේමතිලක		
මුතුරාජවෙල, සිංහරාජ වන රක්ෂිතයන් සහ මොන්ටේන් වනාන්තරයට ක්ෂේත්‍ර චාරිකාවන් 1. මුතුරාජවෙල, සිංහරාජ වන රක්ෂිතයන් සහ මොන්ටේන් වනාන්තරයෙන් නවීන ක්ෂේත්‍ර පරාග සහ පාංශු මණ්ඩි ලබාගැනීම. මේ බිම් මට්ටමේ ක්‍රියාකාරකම් මගින් පරාග පොසිලවේදය සහ පැලිනොලොජිකල් ටැපොනොමි පිළිබඳ අවබෝධයක් ලබාගත හැකිය. ක්ෂේත්‍ර ආදර්ශ එකතු කිරීමට පු වි ප උ ආයතනයේ දර්ශනපති උපාධිය සම්පූර්ණ කළ සිසුන් සහභාගි විණි. (දිලුම් ප්‍රභාත් මයා-, B. SC, Diploma, M. Phil)	මැයි- අගෝස්තු	එසුගිය වසරේ ව්‍යාපෘතියේම දිගුවකි. එක් පශ්චාත් උපාධි සිසුවෙකු සහ මම ක්ෂේත්‍ර ආදර්ශ රැස් කිරීමට සහභාගි වුනෙමු. ක්ෂුද්‍ර පිටපත් ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතී.
මඩකලපු කලපුවෙහි පාංශු ස්ථාර අනුක්‍රම අධ්‍යයන ව්‍යාපෘතිය	ජූනි 03-05	පසුගිය වසරේ සිට කෙරීගෙන එන්නකි. මා සහ පශ්චාත් උපාධි අධ්‍යයන සිසුන් දෙදෙනක්

ආචාර්ය අර්ජුන තන්තිලගේ		
විද්‍යාපති ක්ෂේත්‍ර පාසල	සති 02	පශ්චාත් උපාධි අධ්‍යයන සිසුන්
සංචාරක පුරාවිද්‍යා සිසුන්ගේ ප්‍රායෝගික අභ්‍යාස	දින 04	සංචාරක ඩිප්ලෝමා සිසුන්
ආචාර්ය ඩී එම් ආර් ඒ බණ්ඩාර මයා		
19වන සියවසේ දක්ෂිණ ශ්‍රී ලංකාවෙහි බෞද්ධ සිතුවම් පිලිබඳ දැනුම ලබාගැනීම	දින 02	සහභාගිවූවන් 15
19 සියවසේ සහ 20 වන සියවසේ මුල් භාගයේ ශ්‍රී ලංකාවේ දක්ෂිණ සහ බස්නාහිර පලාත්හී බෞද්ධ සිතුවම් පිලිබඳ දැනුම ලබාගැනීම	එක් දින	සහභාගිවූවන් 15
ගිරිබාව සහ ආසන්න පෙදෙස්හී පුරාවිද්‍යා ගවේෂණ	දින 02	සහභාගිවූවන් 20

ඇ). ලබාගත් ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සම්මාන

ජාතික මට්ටමේ සම්මාන

සම්මාන/සම්මානයන්ගේ නම	විස්තරය	සම්මාන දිනය/මාසය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව		
රාජ්‍ය සාහිත්‍ය සම්මානය	නම් කරන ලදී	

ජාත්‍යන්තර සම්මාන

සම්මාන නාමය	විස්තරය	සම්මාන දිනය/ මාසය
ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක		
1.ජාත්‍යනතර චතුර්ථික සංගමය මානව ජෛවගෝලීය කොමිසමෙහි උප සභාපති (INQUA HABCOM)	ජාත්‍යනතර චතුර්ථික සංගමය මානව ජෛවගෝලීය කොමිසම (INQUA HABCOM) හී කාර්යභාරය වනුයේ ලොව රටවල් 52 ක් ජාලගත කරමින් චතුර්ථික පර්යේෂණයන්හී අත්හදා බැලීම් සහ භාවිත පාර්ශවයන් හී ජාත්‍යන්තර සහයෝගීතාව සහ දියුණු කරන ලද සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම සහ චතුර්ථික විද්‍යාවේ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම වේ. පෙර දේශගුණික සහ පාරිසරික වෙනස්කම් මූලික අවධානය වේ.	1. 01/05/2023 https://inqua.org/commissions/ HABCOM/ජනතාව (2023-2027 අන්තර් සංගම් කාල පරිච්ඡේදය තුළ)
2. ඉන්දියවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය සහ ෂර්මා අධ්‍යාපන සහ උරුම අධ්‍යයන ආයතනයේ ජාත්‍යන්තර පර්යේෂණ විද්‍යාඥ	ප්‍රංශයේ ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරය, ඉන්දියවේ පොන්ඩිචේරි හී ප්‍රංශ ආයතනය, ප්‍රංශයේ CNRS සහ ඉන්දියාවේ ෂර්මා අධ්‍යාපන සහ උරුම අධ්‍යයන ආයතනයේ සංවිධානය යටතේ ඉන්දියාවේ *MANDU* (MANDU and PalaeoHome) පර්යේෂණ ව්‍යාපෘතියට සහය දීම	2. 2024-2027
3.ප්‍රධාන දේශක	ඉන්දියාවේ බෙංගලාරුහී උසස් විද්‍යාත්මක පර්යේෂණ පිළිබඳ ජවහර්ලාල් නේරු මධ්‍යස්ථානයේ (JNCASR) ',දේශගුණික විපර්යාස සඳහා ක්‍රියාත්මක වීම-මූලයන් සහ බලපෑම් ගැන අවධානය සහිතව' යන තේමාව යටතේ (Climate Action: addressing Causes and Impact) තරුණ විද්‍යාඥයන්ගේ රැස්වීම	3. 2024 දෙසැම්බර් 10-12
4. එක්සත් ජනපදයේ නාසා ආයතනයේ සහයෝගී පර්යේෂක	ශ්‍රී ලංකාවේ පොලොන්නරුව ප්‍රදේශයට ඇද වැටුණ වෙනත් ග්‍රහ වස්තූන්ගේ පොසිල පරාග අන්තර්ගතය තුළින් පිට සක්වල ජීවිතයෙහි සම්භවය අවබෝධ කරගැනීම	2023-2025

වෙනත් සම්මාන

සම්මාන නාමය	විස්තරය	සම්මාන දිනය/ මාසය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව		
මෙල්බර්න් හී හෙරිටේජ් එලයන්ස් මගින් ශ්‍රී ලං රු මිලියන 1.2 ක ප්‍රදානයක්	මීමුරේ කැණීම සිදුකිරීම පිණිස	2024/08/07
ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක		
1.මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩල සාමාජික	මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යයන/ කළමණාකාරීත්ව/	2022/10/01 සිට 2024 අවසානය දක්වා අබණ්ඩව

	පරිපාලනකටයුතු සඳහා සහය සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය/ පාලක මණ්ඩලය වෙතින් සෘජු පත්වීම්	
2.මධ්‍යම සංස්කෘතික අරමුදලේ විගණන කමිටු සාමාජික	මධ්‍යම සංස්කෘතික අරමුදලේ කළමණාකාරීත්ව/ පරිපාලන කටයුතු සඳහා සහය සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය/ පාලක මණ්ඩලය වෙතින් සෘජු පත්වීම්	2023/12/22 සිට 2024 අවසානය දක්වා අඛණ්ඩව
3. දේශගුණික දෝලනයන් සහ රාජවංශික ප්‍රවණතාඉන්දීය උප මහාද්වීපයෙහි ගෙවුන මිලියන දෙකක කාලය තුළ බහුවිධ විශ්ලේෂණයන්-අත්පිටපත් අංක CATENA24993, 2024.	එල්සේවියර් විසින් පල කරන ලද Citation Index Journal හී සම-සමාලෝචන කටයුතු	2024
ආචාර්ය එන්.පී.ආර් නාන්නකදුර		
බ්‍රික් සම්මානය- ප්‍ර.වි.ප.උ ආයතනය	ආචාර්ය උපාධි පර්යේෂණය වෙනුවෙන් විශිෂ්ඨතා සම්මානය	2024/05/04
ආචාර්ය ඩී එම් ආර් ඒ බණ්ඩාර මයා		
බ්‍රික් සම්මානය- ප්‍ර.වි.ප.උ ආයතනය	පුරාවිද්‍යා ආචාර්ය උපාධිය වෙනුවෙන් අධ්‍යයන විශිෂ්ඨතා -2023 වසර, සුවිශිෂ්ට කැපවීම සහ අධ්‍යයන විශිෂ්ඨතාව වෙනුවෙන් ජීපීඒ 4 සහිතව විශිෂ්ඨ සම්මාන ලැබීම. පුරාවිද්‍ය පශ්චාත් උපාධි ආයතනය, කැළණිය විශ්ව විද්‍යාලය	2024 තු 17

- **විදේශ විශ්ව විද්‍යාල සමඟින් පර්යේෂණ සහ පර්යේෂණ සහයෝගීතාව පවත්වා ගැනීම සහ අධ්‍යයන සහයෝගීතාවට පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය**

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී

- 2024/02/01 -'ජාත්‍යන්තර සමුදුරු උපායමාර්ග ඒර්යේෂණ මධ්‍යස්ථාන, උපදේශක සාමාජිකයෙකු ලෙස පත්වීම
- 2024/02/28-'සීගිරිය සහ භූමි දර්ශනය මැයෙන් පවත්වන ලද දේශනය- ඩීකින් විශ්ව විද්‍යාලය, ඔස්ට්‍රේලියාව
- 2023/03/03-දේශනය-සිංහ සමාජය, මෙල්බර්න් ඔස්ට්‍රේලියාව

ඈ) පොදු ප්‍රකාශන උදෙසා පල කිරීම්

ඈ1) ජාතික මට්ටමේ වැඩ සටහන් සමග සහයෝගීව කටයුතු කිරීම

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී

- 2024/01/24-ඉන්දියාවේ 75වන නිදහස් දිනය පිලිබඳ සාකච්ඡාව-සංස්කෘතික අංගයන් පිලිබඳ වැඩසටහන
- 2024/02/05-ලෝක උරුම වැඩබිම් පිලිබඳ සාකච්ඡාව

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව

- පරිසර අමාත්‍යාංශයේ ස්වදේශික දැනුම පිලිබඳ කමිටුවෙහි සාමාජිකයෙකු ලෙස දායකත්වය සැපයීම
- මුලතිවු මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලද නියෝග පරිදි අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යා උපදේශකයකු වශයෙන් කොක්කුතුඩුවායි හී සමූහ මිනීවල පිලිබඳ විමර්ශනයට දායකත්වය සැපයීම
- මන්නාරම මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලද නියෝග පරිදි අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යා උපදේශකයකු වශයෙන් මන්නාරමෙහි සමූහ මිනීවල පිලිබඳ විමර්ශනයට දායකත්වය සැපයීම
- කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලද නියෝග පරිදි අධිකරණ වෛද්‍ය පුරාවිද්‍යා උපදේශකයකු වශයෙන් කොළඹ වරායෙහි සමූහ මිනීවල පිලිබඳ විමර්ශනයට දායකත්වය සැපයීම

මහාචාර්ය ඩී.පී ගමලත්

- ඉන්දික ගුණවර්ධන සමරු දේශනය පැවැත්වීම- **කැලණි මිටියාවත ඓතිහාසික සමාජ-දේශපාලන උරුමය-2024 පෙබරවාරි 08**
- ආරාධිත දේශනය, ශ්‍රී ලංකා ජාතික සංචාරක මාර්ගෝපදේශ ආයතනයේ අධ්‍යාපන වැඩසටහන් අංශය මගින් සංවිධානය කරන ලද වැඩ සටහනෙහි පොලොන්නරුවේ පුරාවිද්‍යාත්මක පර්යාවලෝකයන් මැයෙන් පවත්වන ලද දේශනය. සාමාජිකයන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් 2024 අප්‍රියෙල් 26 වන දින දේශනය සාර්ථකව පවත්වන ලදී.

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක

- ශ්‍රී ලංකාවේ කැබැල්ල ලෙන (ප්‍රාග් ඓතිහාසික ගුසා වැඩබිම) පාරිසරික පුරාවිද්‍යා පර්යේෂණය සඳහා පර්යේෂණ සහය ලබා දීම. මෙය අනුරාධපුර භික්ෂු සරසවියෙහි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් පවත්වන ලද ආචාර්ය උපාධි වැඩසටහනකට සහය වශයෙනි. අධ්‍යයන වැඩ සටහනට මගේ වැදගත් දායකත්වය ලබාදීමෙන් පසුව එහි අවසන් ප්‍රකාශනය එල්සේවියර් ආයතනය විසින් පල කරනු ලබන Archaeological Science ජර්නලය වෙත ඉදිරිපත් කරන ලදී.

ආචාර්ය අර්ජුන තන්තිලගේ

- විදෙස් සරසවි සමග අධ්‍යයන සහයෝගය සහ පර්යේෂණ සහ පර්යේෂණ සහයෝගීතාව පිළිබඳව පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය -01
- පොදු ප්‍රකාශන පල කිරීම-ජාතික වැඩ සටහන් සමග සහයෝගීතාවෙන්-02
- ජාතික අධ්‍යාපන ආයතනය /මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුහුණු කාර්ය මණ්ඩලය/පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග සහයෝගීතාව-10
- පොදු දැනුවත් කිරීමේ වැඩසටහන්-02

ආචාර්ය එන්.ජී.ආර් නාන්කඳුර

- ජාතික අධ්‍යාපන ආයතනය /මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුහුණු කාර්ය මණ්ඩලය/පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග සහයෝගීතාව
- මහරගම අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පිණිස 2024 වසරේදී විෂය මාලාවේ පළමු කෙටුම්පත සකස් කරන ලදී.
- මහරගම අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින් ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව පිණිස 2024 වසරේදී සවිස්තරාත්මක විෂය මාලාව සකස් කරන ලදී

ආචාර්ය ඩී.එම්.ආර්.ඒ බණ්ඩාර

- ගිරිබාව පබළුගල වීදුරු නිෂ්පාදන වැඩබිමේ කැණීම් ව්‍යාපෘතිය -පුරාවිද්‍යා සහ කෞතුකාගාරවේදය පිලිබඳ විද්‍යායතනය, සිචුවාන් විශ්ව විද්‍යාලය, සංස්කෘතික සම්පත් සහ පුරාවිද්‍යාව පිලිබඳ සිචුවාන් පලාත් ආයතනය, චීනයේ සංස්කෘතික සම්පත් සහ පුරාවිද්‍යාව පිලිබඳ චෙන්ග්ඩු ආයතනය, කැළණිය විශ්ව විද්‍යාලය සමග හවුල් ව්‍යාපෘතියකි

ඇ 2) ජාතික අධ්‍යාපන ආයතනය /මධ්‍යම සංස්කෘතික අරමුදලේ පුහුණු කාර්ය මණ්ඩලය/පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග සහයෝගීතාව

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුහුණු කාර්ය මණ්ඩලය
කෘෂිකර්මාන්තයේ පුරාවිද්‍යාව කෙරේ විද්‍යාත්මක ක්‍රමාණුකූල ප්‍රවේශයක් සඳහා වන අවබෝධයක් උදෙසා පවත්වන ලද දේශනය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි මූල පිරුමකි.

ආචාර්ය එම්.ආර්.ඒ බණ්ඩාර

- පින්වැව ගල්සොහොන් කනත්ත ක්ෂේත්‍ර පාසල 2024 (අගෝස්තු-දෙසැම්බර්)
  - i) පුරාවිද්‍යා (විශේෂ) 4වන වසර කණ්ඩායම-කැළණිය විශ්ව විද්‍යාලය
  - ii) පුරාවිද්‍යා (විශේෂ) 3වන වසර කණ්ඩායම-රුහුණු විශ්ව විද්‍යාලය
  - iii) පුරාවිද්‍යා (විශේෂ) 4වන වසර කණ්ඩායම-පේරාදෙණිය විශ්ව විද්‍යාලය

iv) පුරාවිද්‍යා (විශේෂ) 4වන වසර කණ්ඩායම-යාපනය විශ්ව විද්‍යාලය
v) පුරාවිද්‍යා (විශේෂ) 4වන වසර කණ්ඩායම-රජරට විශ්ව විද්‍යාලය

- අම්පාර සමන්ගල ස්ථූප කැණීම් ව්‍යාපෘතිය-පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- නැගෙනහිර පලාතේ පුරාවිද්‍යා නිලධාරීන් උදෙසා වන දේශනය, සංවිධානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- පුරාවිද්‍යා ප්‍රපංචයන් සහ එහි ස්වභාවය පිලිබඳ වැඩමුළුව-හඳුනාගැනීම, නාමකරණය සහ ලේඛණගත කිරීම-වයඹ පලාතේ පොතුහැර පුරාවිද්‍යා නිලධාරීන් සඳහා, සංවිධානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

බුලත්සිංහල මොනිකා

- අමර සමර්චනා : "ශ්‍රී ලංකාවේ පුස්තකාල සහයෝගීතා ක්‍රියාකාරිත්වය 2000 – 2008 ": : දිල්හානි ඉනෝකා ජී එච්.: සංස්කරණය ඩබ් ඒ විජේසූරිය සහ පූජ්‍ය බෝපැත්තේ සෝමානන්ද හිමි: ජේ ඒ අමරවීර සමරු වෙළුම, 2024.
- මිනුම් තොරතුරු සේවා සහ පරිශීලක තෘප්තිය-සිද්ධි අධ්‍යයනයකි: උසස් අධ්‍යාපන ආයතනයන්හි දැනුම් කළමණාකරනය, වෙළුම 1, 2024, පිටු අංක 171-179, ජායිපූර්, මනිපාල් විශ්ව විද්‍යාලය, ජායිපූර් (ඉන්දියා)

(ඈ 3) මහජන දැනුවත් කිරීමේ වැඩ සටහන්

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව

- ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ පුරාවිද්‍යාව පිලිබඳව දැනුම ප්‍රචලිත කරනු පිණිස ගුවන් විදුලි සංවාද 44ක් සිදු කරන ලදී (පැය 1.5 බැගින් වූ වැඩ සටහන්)
- මාතර සායනික සමාජය උදෙසා දේශනයක් පවත්වන ලදී
- කරාපිටිය රෝහලේ සායනික සමාජය උදෙසා දේශනයක් පවත්වන ලදී
- ශ්‍රී ලංකා රක්තවේද විශේෂඥයන්ගේ සංගමය උදෙසා දේශනයක් පවත්වන ලදී
- මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය උදෙසා දේශනයක් පවත්වන ලදී

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක

- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හරහා විකාශන කරනු ලබනා විදුල අධ්‍යාපන වැඩ සටහනෙහි සෑම සතියක් පාසා අධ්‍යාපන වැඩ සටහන් තුනක් පැවැත්වීම.
- වයඹ පලාතේ වැල්ලව මධ්‍ය මහා විද්‍යාලය පිළිබඳ ප්‍රසිද්ධ දේශන වැඩසටහනක් මගින් පාසල් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

ආචාර්ය එන්.පී.ආර් නාන්කඳුර

- 2024 වසරේදී සංස්කෘතික අමාත්‍යාංශය සමග සහයෝගයෙන් තීර්ථ කතන්දර කීමේ වේදිකාවේ සංකල්ප නිර්මාපකයකු සහ සම්පත්දායකයකු ලෙස කටයුතු කරන ලදී
- ඉංගිරිය විවිඩ් ඔප් වොයිඩ් ගෘෘප් සංවිධානයෙන් ඉංගිරිය පැරණි තේ කම්හලෙහිදී දෘෂ්‍ය මාධ්‍ය සමග කටයුතු කරන්නේ කෙසේද මැයෙන් 2024 වසරේදී දේශනයක් පවත්වන ලදී
- 2024 වසරේදී දෙපානම පන්නිපිටියේ සිරස රූපවාහිනිය මගින් සංවිධානය කරන ලද වැඩ සටහනකදී ශ්‍රී ලංකාවේ ශෛලමය කලාව මැයෙන් දේශනයක් පවත්වන ලදී

ආචාර්ය එම්.ආර්.ඒ බණ්ඩාර

- මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් යෝජිත සීතාවක කෞතුකාගාරයෙහි විශේෂඥ කමිටුවෙහි සාමාජික

ඈ4) අනෙක් දෙපාර්තමේන්තු සහ ආයතන (මධ්‍යම සංස්කෘතික අරමුදල/ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව/ ජාතික කෞතුකාගාරය වැනි ආයතන) අධ්‍යයන සහයෝගීතාව ප්‍රවර්ධනය/ පහසුකම් සැලසීම/ සහ පර්යේෂණ සහයෝගීතාව පවත්වා ගැනීම

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරී

- 2024/01/29-මාසික දේශනය- ජාතික කෞතුකාගාරය-' දක්ෂිණ ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික වැඩබිම් සහ ද්‍රව්‍ය සංස්කෘතිය'
- 2024/03/23-මියන්මාර් ශ්‍රී ලංකා වැඩ සටහන- ICOMOS සහ පු වි ප උ ආයතනය

ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලය සමග සහයෝගයෙන් කැබැල්ල ලෙන කැණීම් ව්‍යාපෘතිය

ආචාර්ය එන්.පී.ආර් නාන්කඳුර

- 2024 වසරේදී රුහුණු විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂකයන් සඳහා පර්යේෂණ ක්‍රමවේදය පිලිබඳ දේශනයක් පවත්වන ලදී
- 2024 වසරේදී සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලයෙහි දෘෂ්‍ය කලා පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරයෙහි කලා මූලධර්ම පිලිබඳව දේශනයක් පවත්වන ලදී

ආචාර්ය එම්.ආර්.ඒ බණ්ඩාර

(ජාතික සේවා සඳහා දායකත්වය)

- ක්ෂේත්‍ර පුරාවිද්‍යා උපදේශක, මධ්‍යම සංස්කෘතික අරමුදල, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- කුරුන්දි විහාර වැඩ බිමෙහි පුරාවිද්‍යා සමීක්ෂණයක් පැවැත්වීමේ විශේෂඥ කමිටුවෙහි සභාපති, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- යෝජිත සීතාවක කෞතුකාගාර ව්‍යාපෘතියෙහි විශේෂඥ කමිටුවේ සාමාජික, මධ්‍යම සංස්කෘතික අරමුදල, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- සමන්ගල ස්ථූපයේ සංරක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් උපදෙස් සැපයීම පිණිස වන විශේෂඥ කමිටුවේ සාමාජික, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- මාර්ග ෂංවර්ධන අධිකාරියේ රත්නපුර කාර්යාලයේ ආරක්ෂිත සේප්පුවේ පෞරාණිකත්වය තීරණය කිරීමේ කමිටුවෙහි සභාපති, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- කෑගල්ල දැලිවල කොටවෙහෙර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිරීක්ෂණ ලබාගැනීම පිණිස වන කමිටුවෙහි සාමාජික, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, බුද්ධ සාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ඉ). අධ්‍යයන කාර්යමණ්ඩලයේ ප්‍රකාශන.

කතෘ/කතෘන්	ලිපිය/ ප්‍රකාශනය	ප්‍රකාශක	ප්‍රකාශන මාලාවේ/ ජර්නලයේ නම
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව			
1. රාජ් සෝමදේව	සැලළිහිණි සංදේශය-සමාජ විද්‍යාත්මක විශ්ලේෂණයක්	වාෂා ප්‍රකාශකයෝ	සැලළිහිණි සංදේශය-දෘෂ්‍ය චාරිකාවක්
2.රාජ් සෝමදේව	Why does colour matter? Prehistoric use of colours in Sri Lanka.	ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය	Colours and human wellbeing
3.රාජ් සෝමදේව	Sēla Chetiyas : A forgotten Form of Religious Architecture in Sri Lanka	Open Access, Peer reviewed, Refereed Journal	JHSR Journal of Historical Studies and Research ISSN: 2583 0198 Volume 4, Number 3 (September-December,2024),PP.01 179.

මහාචාර්ය ඩී.පී ගමලත්			
මහාචාර්ය ධනනංජය ගමලත්,	"Theravada Buddhism as the state religion and the interweaving of other cults and the tradition of Vaitulyavism	නාගානන්ද බෞද්ධ විශ්ව විද්‍යාලය	Nāgānanda International Journal of Humanities & Social Sciences Vol: 6 , No. 3, 2023 pp. 55-66
ආචාර්ය ටී.ආර් ප්‍රේමතිලක			
ආර්.ප්‍රේමතිලක, ආර් හන්ට් සහ සී පෙරේරා PPDC	Differentiating wild and domesticated bananas using volcaniform phytolith morphology and dimensions: Evidence from Sri Lanka.	Elsevier	INQUA (International Union for Quaternary Research)
ආර්.ප්‍රේමතිලක හේරත් ජේ-2024	Late Holocene climate and environmental changes from Bundala, Southeastern Sri Lanka	Taylor and Francis, UK	Publishes international research on palynology and palaeobotany, including archaeological palynology, biostratigraphy, floral history and forensic palynology.
ආර්.ප්‍රේමතිලක හේරත් ජේ-2024	නියමු ව්‍යාපෘතියකි: Understanding Late Pleistocene and Holocene Sea Level, Climate Changes and Human Activities from Southeastern Sri Lanka	Crimson Publishers: Wings to the Research; ISSN: 2577-1949	Mini-Research review series by Crimson Publishers, USA
ආර්.ප්‍රේමතිලක ගුණසේකර එස් අනුපමා කේ සිරිනිවාසන් පී 2024	Middle-Late Holocene environmental changes from Batticalo lagoon, Sri Lanka	IFP, IndiaHosted by Mount Royal University, Canada.	SEDRIC project Report at IFP
ජෙනිෆර් බේට්ස් ආර්.ප්‍රේමතිලක සහ තවත් අය 2024	Early to Mid-Holocene Land Use Transitions in South Asia: a new archaeological (synthesis of potential human impacts)	Plus One, an Index Journal	PLOS ONE is an inclusive journal community working together to advance science for the benefit of society, now and in the future.
ආචාර්ය අර්ජුන තන්තිලගේ			
එම්.ඩී.අයි.කේ අබේනායක කේ.හෙට්ටිආරච්චි කේ එම් ඇලෙක්සැන්ඩර් ඒ.තන්තිලගේ ජේ.සේනානායක එල් විතානගේ ජී.ටී බදුරලිය	The Study on Plaster Materials: Special Reference to Rajagala Cave Dwellings	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	The Journal of Archaeology and Heritage Studies (JAHS) 2023
තන්තිලගේ ඒ	A Scientific Study of Bronze Tara image from Sri Lanka at the British Museum for evaluating its provenance	කැළණිය විශ්ව විද්‍යාලය	TRIVALENT: Indexed Journal of Archaeology
ආචාර්ය එන්.පී.ආර් නාන්කඳුර			
එන්.පී.ආර් නාන්කඳුර	Depictions of Women in Murals from Buddhist Temples in the Western Province-part 1	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සංගමය	*Vaasthu* Journal-Vol; issue I, 2024
එන්.පී.ආර් නාන්කඳුර	Depictions of Women in Murals from Buddhist Temples in the Western Province-part 2	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සංගමය	*Vaasthu* Journal-Vol; issue II, 2024
ආචාර්ය එම්.ආර්.ඒ බණ්ඩාර			
යු.නි.යු.ලී මංගල කටුගම්පොල රංජිත් බණ්ඩාර දිසානායක ටී.ජී.කේ.ප්‍රියන්ත (සම කතෘ)	Pabalugala: 1st – 5th Centuries Glass Bead Production Site in Sri Lanka	Cambridge University Press, Antiquity Publication Ltd.	Antiquity
බුලත්සිංහල මොනිකා			
බුලත්සිංහල මොනිකා	"විශේෂ පුස්තකාලයක් වූ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය" (මුද්‍රණයේ)	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	කෞතුකාගාරය

12. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විමර්ශණ පුස්තකාලය

වාර්ෂික වාර්තාව 2024

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පුරාවිද්‍යාව සහ ඊට අදාල ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශිෂ්ඨ පුස්තකාල සහ විඥාපනසේවා මධ්‍යස්ථානයක් සංවර්ධනය කර තිබේ. මෙය සෑම සරසවියකටම, පර්යේෂකයන්, සිසුන්, සහ උන්නදුවක් දක්වන මහජනයා හට විවෘතය. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ එකතුව පොත් සහ සඟරා ලිපි, සිතියම් සහ ඡායාරූප 21,000කට වඩා වන අතර එය දැන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු පුස්තකාලය, ජාතික කෞතුකාගාර පුස්තකාලය, රාජකීය ආසියාතික සමාජ පුස්තකාලය, සහ යාපනයේ එව්ලින් රත්නම් ආයතනයේ පුස්තකාලය වැනි ප්‍රධාන පර්යේෂණ පුස්තකාල හා සම තත්වයේ පවතී. තවද මේ පුස්තකාලයෙහි ලියාපදිංචි පාඨකයන්ට දුරකථන තොරතුරු සේවාවක් ඇතුළුව විශාල විෂය පථයක් ආවරණය කරමින් ඉංග්‍රීසි බසින් ලියැවෙන සඟරා සහ සම්පූර්ණයෙන්ම පරිගණකගත කරන ලද සුචියක් තිබේ. මේ පුස්තකාලය පුරාවිද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ පහසුව තකා සතියේ දින සහ සෙනසුරාදා සහ ඉරිදාද විවෘතව පවතී. වර්තමානයේදී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය පුරාවිද්‍යාව සහ ඊට අදාල අනෙක් ශීක්ෂණයන් සම්බන්ධයෙන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

දැක්ම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලය ශ්‍රී ලංකාව සහ දකුණු ආසියාව තුළ පුරාවිද්‍යාව සම්බන්ධයෙන් වන ප්‍රධානතම පුස්තකාලයක් බවට පත් කිරීම සහ රටෙහි පුරාවිද්‍යාව සම්බන්ධයෙන් ඇති ජාතික මට්ටමේ විශිෂ්ඨතම පුස්තකාලය ලෙස පවත්වාගෙන යාම.

අරමුණු

පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වනුයේ පුරාවිද්‍යාව සම්බන්ධයෙන් වන දැනුම ප්‍රවර්ධනය කිරීමයි. එසේම විවිධ පුරාවිද්‍යා ව්‍යාපෘති වලට අදාලව ඇති සිතුවම්, ඡායාරූප සහ පටප පට වැනි මූලික පර්යේෂණ ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීමද මෙහි ප්‍රමුඛ කාර්යයන් අතර වේ.

පුස්තකාලයේ සාර්ථකත්වය 2024

2024 වසර තුළ පුස්තකාලය පරිහරණයට පැමිණි පාඨකයන් සංඛ්‍යාව-809

වාර්ෂික එකතුකිරීම් /පුස්තකාල පරිත්‍යාග

2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කෘති 17 ක් පුස්තකාලයට එකතු කරන ලදී.
2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පුස්තකාලයට එක් කරන ලද ජර්නල් සංඛ්‍යාව 11 කි.
2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා පරිත්‍යාග ලෙස පුස්තකාලයට එක් කරන ලද පොත් සහ ජර්නල් සංඛ්‍යාව 356 කි.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාව, සමාජ විද්‍යාව, සහ වාස්තු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හී ප්‍රමුඛයන් වන ශාස්ත්‍රවන්තයන්/ පර්යේෂකයන් පුස්තකාලයට වටනා පොත් සහ ජර්නල් පරිත්‍යාග කළෝය. ඒ අය පහත දැක්වේ.

- මහාචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි
- මහාචාර්ය ඩී පී ගමලත්-මහාචාර්ය පු.වි.ප.උ.ආ
- ආචාර්ය ප්‍රීමිනි හෙට්ටිආරච්චි
- වාස්තු විද්‍යාඥ ඉස්මත් රහීම්
- පූජ්‍ය මාන්කඩවල නන්දරතන හිමි
- අනුෂා වන්නිනායක මිය
- සරලා ප්‍රනාන්දු මෙය
- ජගත් සුමතිපාල මයා/ සභාපති බෞද්ධාලෝක පදනම

ආයතන

- මධ්‍යම පරිසර අධිකාරිය
- රජරට විශ්ව විද්‍යාලය
- බෞද්ධාලෝක පදනම

විශේෂ පරිත්‍යාග

සෝමසිරි දේවේන්ද්‍ර මහතා (ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ශ්‍රී ලංකා නාවුක හමුදාව) -පුස්තකාලයට වටනා එකතුවක් පරිත්‍යාග කළේය (අදියර 03)

- අදියර 03-06 (පරිග්‍රහණ අංක එක් එස් ඩී 458-463) ලද පොත් සහ ජර්නල් සංවිධානය කරන ලදී (2024)
- වෙවු පෙරී බ්‍රෝහියර් (දිවංගත ආචාර්ය ආර් එල් බ්‍රෝහියර් (දර්ශනශූරී (ලංකා))වටනා එකතුව පුස්තකාලයට පරිත්‍යාග කරන ලදී
- පොත් සහ ජර්නල් 350ක් (පරිග්‍රහණ අංක එල්බී ආර් 001-එල්බී ආර් 350) ලද අතර මනාව සංවිධානය කරන ලදී (2024)

<u>පුස්තකාල සේවා</u>

- විද්‍යුත් තොරතුරු සේවාව
  පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, පශ්චාත් උපාධි සිසුන් (පශ්චාත් උපාධි/ විද්‍යාපති/පශ්චාත් උපාධි ඩිප්ලෝමා), සහ ශාස්ත්‍රවන්තයන් වෙත විද්‍යුත් තැපැල්, වට්ස්ඇප්, මගින් (පරිලෝකන, තොරතුරු බෙදාහැරීම්) පුස්තකාල ද්‍රව්‍ය (අවශ්‍ය කියවීම් ලේඛණ, විද්‍යුත් පොත්, විද්‍යුත් ලිපි, යනාදිය) බෙදා හරින ලදී
  තෝරාගත් පිටු සහ පරිච්ඡේද විද්‍යුත් පොත් සහ විද්‍යුත් ලිපි සරණිය
  පුස්තකාලයේ ඇති තෝරාගත් පිටු 63 සහ පරිච්ඡේද විද්‍යුත් පොත් සහ විද්‍යුත් ලිපි සරණිය 2024 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා පුස්තකාලයේ තෝරාගත් පිටු සහ පරිච්ඡේද විද්‍යුත් පොත්, සහ විද්‍යුත් ලිපි එකතුන් 25 පරිශීලනය පිණිස ඇත.
  පරිලෝකනය කරන ලද අදාල ප.උ.ඩිප්ලෝමා පරණ ප්‍රශ්ණ පත්‍ර 2012 -2021
  පරිලෝකනය කරන ලද ශාස්ත්‍රවේදී/ විද්‍යාපති පරණ ප්‍රශ්ණ පත්‍ර 2012-2021

- **අන්තතර් පුස්තකාල පොත් සේවාව**
  ලද පොත්- පුස්තකාලය, කැළණිය විශ්ව විද්‍යාලය
  මාතෘකාව-:ල.කාවේ ඓතිහාසික භූමි සිතුවම් - කුඩාවැල්ලේ ධීරානන්ද කල්‍යාණ වංශ හිමි

<u>පුස්තකාල ප්‍රකාශන</u>

අමර සමර්චනා , "ශ්‍රී ලංකාවේ පුස්තකාල සහයෝගීතා ක්‍රියාකාරිත්වය 2000 – 2008 ": දිල්හානි ඉනෝකා ජී එච්.: සංස්කරණය විජේසූරිය ඩබ් ඒ සහ පූජ්‍ය බෝපැත්තේ සෝමානන්ද හිමි: ජේ ඒ අමරවීර සමරු වෙළුම 2024

Measuring Information Services and user satisfaction : A case study : Knowledge management in higher education institutions,Vol.1, 2024, pp. 171 – 179 , Jaipur : Manipal University of Jaipur (India).

"විශේෂ පුස්තකාලයක් වූ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලය") , 2024

පු.වි.ප.උ ආයතනයේ පුස්තකාල සාමාජික ගාස්තු

- **තාවකාලික සාමාජික ගාස්තු- ඉපයුම් රු. 11,800**
- **ශිෂ්‍ය සාමාජික ගාස්තු**

දර්ශන ශූරී, විද්‍යාපති, ශාස්ත්‍රපති, දර්ශනවිද්‍යා සිසුන්ගෙන් රු. 110,000
ඩිප්ලෝමා සිසුන් රු. 78,000
ඉපයුම් රු, 188,000

පාඨකයන්

පුස්තකාල පාඨකයන් 2023 සහ 2024

මාසය	2023	2024
ජනවාරි	202	184
පෙබරවාරි	150	82
මාර්තු	112	110
අප්‍රියෙල්	99	113
මැයි	222	0
ජූනි	272	0
ජූලි	292	33
අගෝස්තු	75	174
සැප්තැම්බර්	127	42
ඔක්තෝබර්	94	20
නොවැම්බර්	126	0
දෙසැම්බර්	106	51

සටහන-මැයි -ජූනි- විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය නොවැ-පුස්තකාල සත්‍යාපනය 2024

ආයතනයේ ප්‍රකාශන අලෙවිය

ප්‍රකාශනයේ නම	අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව
ජනාවාස පුරාවිද්‍යාව	23
Maritime archaeology in Sri Lanka : the Galle harbor project 1992	12
Urban origins in Southern Sri Lanka	07
Roland Silva felicitation volume	09
Galpaya survey : Report of the first field season 2006	04
A catalogue of ancient pottery from Sri Lanka	15
Archaeology of the Udawalawe basin	08
Sri Lankan bronzes	05
ගිං ගඟේ කිඹුල් මන්ත්‍රය	06
Settlement patterns in Malwathu Oya and Kala Oya Basin	08
The archaeology of mountains: Holocene adaptation of prehistoric hunter gatherers	05
Archaeological survey settlement in	10
Resource utilization	02
මාර්ග පුරාණය	03
Traversing the megalithic	13
Tambapanni	38

අලෙවි කරන ලද වාර්තා සටහන් සංඛ්‍යාව 2024

වාර්තා සටහන්හී මාතෘකාව	අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව
කෙවුල්ගම දළදා ගමන් මාලිගා විහාරස්ථානයේ පුස්කොළ ලේඛණය	18
උඩරට බිතු සිතුවම් කලාවේ නීල වර්ණය දේශපාලන හා ආර්ථික පෙරළියක ප්‍රකාශනයක් ලෙස	15
Red pigments used in Kandy Period mural	16
දහනවවන සියවසේ සංක්‍රාන්තීය සිතුවම් ශිල්පීන්ගේ වර්ණක කට්ටලයේ සංක්‍රාන්තිය	13
Yellow pigments used in Kandy murals	10
A comprehensive art historical survey on Bemmulla	9
Illankathurei international port site	3
Unpublished inscriptions around Seruwila	6
Distribution prehistoric stone tools in the Mahaweli delta region	3

ප්‍රකාශන අලෙවියෙන් ලද ආදායම- 2024 වසර

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශනයන් අලෙවියෙන් ලද මාසික ආදායම
සමස්ත ආදායම-රු. 279,187.00

මාසය	රු.
ජනවාරි	5340
පෙබරවාරි	11765
මාර්තු	9845
අප්‍රියෙල්	40320
මැයි	-
ජූනි	-
ජූලි	7400
අගෝස්තු	53897
සැප්තැම්බර්	68055
ඔක්තෝබර්	28535
නොවැම්බර්	3150
දෙසැම්බර්	50880

සටහන-මැයි -ජූනි- විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය

පුස්තකාල අංකිතකරණ ව්‍යාපෘතිය

මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විධිමත් සහ කාර්යක්ෂම තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම උදෙසා පුස්තකාලය සංවර්ධනය කරනු පිණිස පුස්තකාල අංකිතකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස අවධානය යොමු කිරීම/ අවශ්‍ය පියවර ගැනීමයි.

පුස්තකාලය එහි සම්පත් දෙයාකාරයකින් සපයා ගනී. එනම් මිලට ගැනීමෙන් සහ පරිත්‍යාග ලෙස ලබාගැනීම වශයෙනි. සෑම වර්ෂයකදීම පුස්තකාලය පොත් සහ වාර සඟරා මිලට ගැනීම උදෙසා පොදු අරමුදලින් වියදම් කරයි. (වසරකට රුපියල් 500,000 වැඩි මුදලක්). පසුගිය වසර 12ක කාල පරිච්ඡේදය තුළ එය රුපියල් 10,842,5350 ක මුදලක් පුස්තකාල සම්පත් මිලට ගැනීම පිණිස වැය කර ඇත. ඊට අමතරව එය ඉතා දුර්ලභ සහ වටනා පොත් එකතු හයක් පවත්වාගෙන යයි. අනුගමනය කරනු ලබනා ආරක්ෂක උපක්‍රම කොතෙක් වුවද පුස්තකාලයේ පොත් නැතිවීම නතර කරගත නොහැකි වී තිබේ. පසුගිය වසර ගණනාව පුරාම මෙය අඛණ්ඩව සිදුව තිබේ. මෙසේ පොත් අස්ථානගත වන ආකාරය පිලිබඳ අදහසක් ඇති කරගැනීම අසීරු වන අතර එහෙයින් පුස්තකාලයේ දැන්ට පවත්නා ආරක්ෂක පද්ධතිය තවදුරටත් සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම හදිසි අවශ්‍යතාවක්ව පවතී.

2020 දෙසැම්බර් 23 වන දින පවත්වන ලද පුස්තකාල කමිටු රැස්වීමේදී පුස්තකාල අංකිතකරණ ව්‍යාපෘතියක් දියත් කිරීමේ අවශ්‍යතාව ගැන තීරණයකට එළඹෙන ලදී. එහෙයින් 2021 ජනවාරි 25 දින පැවති පුස්තකාල කමිටු විශේෂ රැස්වීමට ඉදිරිපත් කිරීමට විශේෂ තාක්ෂණික වාර්තාවක් ඉල්ලා සිටින ලදී. ඒ අනුව මේ වාර්තාව විශේෂ පුස්තකාල උපදේශක කමිටුවට සහ කැළණිය විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ. උප කුලපතිවරිය වෙත මේ වාර්තාව 2021.11.24 දින යවන ලද අතර ඇය එය කැළනිය විශ්ව විද්‍යාලයේ AHEAD ව්‍යාපෘතියට ඉදිරිපත් කර ඇත. AHEAD ව්‍යාපෘතිය මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලිපියක් යවමින් පවසා ඇත්තේ තමන් වෙත ඒ සඳහා අරමුදල් නොමැති බවයි.

අනාගත සංවර්ධනයන්

- උසස්, සහ දුලබ කෘති මිලට ගැනීම
- විශේෂ පුස්තකාල එකතු සංවර්ධනය කිරීම
- අභිලේඛණ එකතු සංවර්ධනය කිරීම
- ඩිජිටල් පුස්තකාල සංවර්ධනය (KOHA මෘදුකාංගය සහ ආරක්ෂක ප්‍රවේශයන් ආදිය)
- අංකිතරකරණ සේවා මගින් තොරතුරු සැපයීම
- අංකිතකරණ මූලාශ්‍ර වල සුලබතාව වර්ධනය කිරීම
- සියළු විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩල සහ විද්‍යාර්ථීන් හට ප්‍රවේශ පහසුකම් සැලසීම
- පුස්තකාල අවකාශ සංවර්ධනය කිරීම (නව ගොඩනැගිල්ලක්)

13. මූල්‍ය ගිණුම් 2024

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්		2024.12.31	2023.12.31
			රු	රු
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපල පිරියත සහ උපකරණ	**2**		971,992,498	983,355,870
ආයෝජන				
ස්ථාවර තැන්පතු	**3**		3,187,427	2,834,537
මුළු ජංගම නොවන වත්කම්			**975,179,925**	**986,190,407**
ජංගම වත්කම්				
තොග වට්ටෝරු/ තොග	**4**		1,217,311	1,402,562
වෙනත් ලැබිය යුතු දේ	**5**		148,888	167,400
ණය සහ අත්තිකාරම්-කාර්ය මණ්ඩල	**6**		3,362,587	3,578,169
අත්තිකාරම්-සැපයුම් සහ සේවා	**7**		92,409	93,551
පෙර ගෙවුම්	**8**		101,346	185,504
වෙනත් ජංගම වත්කම්	**9**		150,000	150,000
මුදල් සහ මුදල් සමාන දෑ	**10**		10,119,420	9,013,731
මුළු ජංගම බැරකම්			**15,191,961**	**14,590,918**
මුළු වත්කම්			**990,371,886**	**1,000,781,325**
බැරකම්				
ජංගම බැරකම්				
සුළු ණයහිමියෝ	**11**		8,250	33,223
තැන්පතු	**12**		160,000	215,000
උපචිත වියදම්	**13**		4,131,524	2,274,827
වෙනත් බැරකම්	**14**		6,192,950	4,292,578
මුළු ජංගම බැරකම්			**10,492,724**	**6,815,628**
ජංගම නොවන බැරකම්				
විශ්‍රාම ප්‍රතිලාභ බැඳුම්	**15**		41,154,066	29,138,183
මුළු ජංගම නොවන බැරකම්			**41,154,066**	**29,138,183**
මුළු බැරකම්			**51,646,789**	**35,953,811**
ශුද්ධ වත්කම්			**938,725,097**	**964,827,514**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්		2024.12.31	2023.12.31
			රු	රු
සමුච්චිත අරමුදල සහ සංචිත				
සමුච්චිත අරමුදල- ජංගම සහ ප්‍රාග්ධන	**16**		(36,355,059)	(12,419,015)
ප්‍රත්‍යාගණණ සංචිත	**17**		971,780,943	972,643,459
සීමා කරන ලද වැය ශීර්ෂ සහ ප්‍රදාන	**18**		3,299,213	4,603,071
මුළු සමුච්චිත අරමුදල් සහ සංචිත			**938,725,097**	**964,827,514**
මුළු ශුද්ධ වත්කම් සහ ස්කන්ධය			**938,725,097**	**964,827,514**

ගිනුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හී අඛණ්ඩ කොටසකි

ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති අනුව පිලියෙල කර ඉදිරිපත් කරන ලදී
මෙකී මූල්‍ය ප්‍රකාශණයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී

සහතික කරන ලද්දේ

එම්.කේ.ඩී ලක්මාලි මිය
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
මූල්‍ය නිලධාරී

ආයතනයේ පාලක සභාව මේ මූල්‍ය ප්‍රකාශ පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධ
වගකීම දරයි
පාලක සභාව වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

ජෙ මහාචාර්ය ඒ.එම්.පී. අධිකාරී
අධ්‍යක්ෂ/ සභාපති කළමණාකරන මණ්ඩලය
ගිණුම් නිලධාරී

ජෙ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි
සාමාජික කළමණාකරන මණ්ඩලය

ජෙ මහාචාර්ය පී.ඒ. පරණගම
සාමාජික කළමණාකරන මණ්ඩලය

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2024	2023
		රු	රු
ආදායම			
විනිමය නොවන ආදායම-පුනරාවර්තන ප්‍රදාන		78,084,000	70,228,000
විනිමය නොවන ආදායම-ප්‍රාග්ධන ප්‍රදාන		200,325	149,765
විනිමය ආදායම-පුනරාවර්තන		8,774,530	10,302,671
මුළු ආදායම		**87,058,855**	**80,680,436**
විනිමය නොවන ගනුදෙනු වලින් ආදායම-ජංගම			
පුනරාවර්තන ප්‍රදාන		78,084,000	70,228,000
විනිමය නොවන ගනුදෙනු වලින් මුළු ආදායම-ජංගම		**78,084,000**	**70,228,000**
විනිමය ගනුදෙනු වලින් ආදායම- ජංගම			
ට්‍යුෂන් ගාස්තු- පශ්චාත් උපාධි		5,590,000	6,645,500
ලියාපදිංචි ගාස්තු- පශ්චාත් උපාධි		175,000	225,500
විභාග ගාස්තු -පශ්චාත් උපාධි		10,500	1,500
කෙටිකාලීන පාඨමාලාවලින් ලද ආදායම		382,686	911,595
ආයෝජන වලින් පොලී	**19**	602,244	794,592
වෙනත් ආදායම්	**20**	2,014,100	1,723,984
විනිමය ගනුදෙනු වලින් ලද මුළු ආදායම -ජංගම		**8,774,530**	**10,302,671**
මුළු ආදායම-ජංගම		**86,858,530**	**80,530,671**
මෙහෙයුම් වියදම් ජංගම			
පුද්ගල ඉපැයුම්	**21**	82,630,008	72,926,782
ප්‍රවාහන සහ උපවේශන	**22**	342,565	3,000
සැපයුම් සහ භාවිත පාරිභෝගික භාණ්ඩ	**23**	601,414	852,490
නඩත්තු	**24**	851,839	1,007,917
ගිවිසුම්ගත සේවා	**25**	7,843,039	8,009,058
කාර්ය මණ්ඩල සංවර්ධන	**26**	-	12,500
වෙනත් මෙහෙයුම් වියදම්	**27**	1,765,368	2,472,071
තථ්‍ය අලාභය		6,259,596	4,028,479
මුලු මෙහෙයුම් වියදම්- ජංගම		**100,293,829**	**89,312,296**
වසර සඳහා ජංගම අලාභය		**(13,435,300)**	**(8,781,625)**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2023 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන	2024	2023
		රු	රු
විනිමය නොවන ගනුදෙනු වලින් ආදායම-ප්‍රාග්ධන			
ප්‍රාග්ධන ප්‍රදාන		-	82,500
ත්‍යාග සහ පරිත්‍යාග-පුස්තකාල පොත්		200,325	67,265
විනිමය නොවන ගනුදෙනු වලින් මුළු ආදායම-ප්‍රාග්ධන		**200,325**	**149,765**
මෙහෙයුම් නොවන වියදම්- ජංගම			
ක්ෂය	**28**	10,542,634	13,297,471
මුළු මෙහෙයුම් නොවන වියදම-ජංගම		**10,542,634**	**13,297,471**
කාල පරිච්ඡේදය සඳහා ප්‍රාග්ධන හිඟය		**(10,342,309)**	**(13,147,706)**
කාල පරිච්ඡේදය සඳහා මුළු හිඟය සමන්විත වනුයේ පහත පරිදි ප්‍රාග්ධන හිඟය සහ පුනරාවර්තන හිඟයෙනි			
කාල පරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය)		**(13,435,300)**	**(8,781,625)**
කාල පරිච්ඡේසදය සඳහා ප්‍රාග්ධන හිඟය		**(10,342,309)**	**(13,147,706)**
කාල පරිච්ඡේදය සඳහා මුළු හිඟය		**(23,777,609)**	**(21,929,331)**
ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හී අඛණ්ඩ කොටසකි			

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

වත්කම්වල/ස්කන්ධයේ වෙනස

			සීමාකරන ලද		ප්‍රතනගණන		සමුච්චිත		සමුච්චිත		මුළු
	සටහන		අරමුදල රු		සංචිත		අරමුදල ජංගම රු		අරමුදල ප්‍රාග්ධන රු		රු
2023 ජනවාරි 01 දිනට ශේෂය			**3,678,588**		**957,284,003**		**(41,947,573)**		**51,429,701**		**970,444,719**
පෙර වසරේ ගැලපුම්			-		-		28,187		-		**28,187**
විශේෂ අරමුදල සහ ත්‍යාග සහ පරිත්‍යාග			924,484		-		-		-		**924,484**
ප්‍රත්‍යාගණන සංචිත (වාහන පිරියත යන්ත්‍ර)			-		15,359,456		-		-		**15,359,456**
2023 වසර සඳහා (හිඟය)			-		-		(8,781,625)		(13,147,706)		**(21,929,331)**
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය			**4,603,071**		**972,643,459**		**(50,701,011)**		**38,281,995**		**964,827,514**
පෙර වසරේ ගැලපුම්	**29**		-		-		(158,434)		-		**(158,434)**
විශේෂ අරමුදල සහ ත්‍යාග සහ පරිත්‍යාග			(1,303,859)		-		-		-		**(1,303,859)**
ප්‍රත්‍යාගණන සංචිත (ඉඩම් සහ ගොඩනැගිලි)			-		(862,515)		-		-		**(862,515)**
2024 වසර සඳහා හිඟය			-		-		(13,435,300)		(10,342,309)		**(23,777,609)**
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය			**3,299,213**		**971,780,943**		**(64,294,745)**		**27,939,686**		**938,725,097**

(සටහන 18)

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැළණිය විශ්වවිද්‍යාලය
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2024.12.31 (රු)	2023.12.31 (රු)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මූල්‍ය ප්‍රවාහය		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද (භාවිත) මූල්‍ය ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද හිඟය	(23,777,609)	(21,929,331)
මූල්‍ය නොවන චලනයන් සඳහා ගැලපුම්		
ක්ෂය	10,542,634	13,297,471
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	5,756,287	5,010,749
පෙර වසරේ ගැලපුම්	113	28,187
ත්‍යාග සහ පරිත්‍යාග	(200,325)	(67,265)
තථ්‍ය පාඩුව	6,259,596	4,028,479
කාරක ප්‍රාග්ධනයේ වෙනසට පෙර මෙහෙයුම් අතිරික්තය	**(1,419,304)**	**368,290**
(වැඩිවීම) /අඩුවීම තොග වට්ටෝරු/තොග	185,251	(96,329)
(වැඩිවීම) /අඩුවීම වෙනත් ලැබීම්	(25,428)	320,217
(වැඩිවීම) /අඩුවීම කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම්	215,582	715,865
(වැඩිවීම) /අඩුවීම ප්‍රාග්ධන අත්තිකාර්ම	-	406,324
(වැඩිවීම) /අඩුවීම සැපයුම් සහ සේවා අත්තිකාරම්	1,142	(68,551)
(වැඩිවීම) /අඩුවීම පෙර ගෙවුම්	84,158	(103,393)
(වැඩිවීම) /අඩුවීම සුළු ණය හිමියෝ	(24,973)	(255,653)
(වැඩිවීම) /අඩුවීම තැන්පතු	(55,000)	-
(වැඩිවීම) /අඩුවීම උපචිත වියදම්	1,856,697	693,433
(වැඩිවීම) /අඩුවීම වෙනත් බැරකම්	1,900,372	865,328
මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල්	**4,137,801**	**2,477,240**
ගෙවන ලද පාරිතෝෂික	-	-
මෙහෙයුම් වලින් ලද ශුද්ධ /(භාවිත)මුදල්	**2,718,497**	**2,845,530**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද /(භාවිත) මුදල් ප්‍රවාහය		
පිරියත/උපකරණ/පුස්තකාල පොත්/ ගොඩනැගිලි	-	(747,824)
ආයෝජන ක්‍රියාකාරකම් හී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**(747,824)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
සීමා කරන ලද වැය ශීර්ෂ	(1,612,808)	543,807
මූල්‍ය ක්‍රියාකාරකම් හී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,612,808)**	**543,807**
මුදල් සහ මුදල් සමාන දේවලින් ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	**1,105,689**	**2,641,513**
කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දේ	9,013,731	6,372,218
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දේ	**10,119,420**	**9,013,731**
2024.12.31 දිනට මුදල් සහ මුදල් සමාන දේ -සටහන 10	**10,119,420**	**9,013,731**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
2024 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

1.1. පොදු ප්‍රතිපත්ති

1.1.1. වාර්තාකරන ආයතනය

1985 දෙසැම්බර් 18 දිනැති නියෝගය මගින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පණතේ 24 ඒ වගන්තිය යටතේ 1986 ජනවාරි 01 දින පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ස්ථාපිත කරනලදී. පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනු කැලණිය සරසවියට අනුබද්ධිත ආයතනයකි.

1.1.2. මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්හී ස්වභාවය.

මෙය පුරා විද්‍යාවට අදාල පශ්චාත් උපාධි අධ්‍යනයන්, මෙන්ම දිවයිනෙහි පුරා විද්‍යා විෂයට අදාල පුරා විද්‍යා පර්යේෂණයන් සඳහා වන මූලික ආයතනයයි.

1.1.3. නිකුත් කිරීම පිණිස බලය ලැබෙනා දිනය

2025.02.25 දින පැවති 350 වන කළමණාකරන මණ්ඩල රැස්වීමේදී ආයතනයේ මූල්‍ය ප්‍රකාශය නිකුත් කිරීම පිණිස බලය ලබාදෙන ලදී.

1.1.4. සැකසීම සඳහා පදනම

අ) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීම් පිලිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. මෙකී මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මූල්‍ය චක්‍රලේඛ අංක 3/2011 මගින් අදාල කරගන්නා ලද ශ්‍රී ලංකා රජයේ ගිණුම්කරන ප්‍රමිති අනුව පිලියෙල කර තිබේ.

ආ) මිණුම් සඳහා පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිලියෙල කර ඇති අතර විශේෂයෙන් සඳහන් කර ඇති අවස්ථාවල හැර මුදල් වටිනාකමෙහි වෙනස්වීම් සැලකිල්ලට නොගනී. පිරිවැය වත්කම් හුවමාරුවේදී දෙනු ලබන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගය මත පදනම්ව තිබේ.

ඇ) අඛණ්ඩ පැවැත්ම
ආයතනයේ මූල්‍ය ප්‍රකාශයන් අඛණ්ඩ පැවැත්ම පිලිබඳ පදනම මත පිලියෙල කර තිබේ.

ඈ) භාවිත සහ ඉදිරිපත් කරනු ලබනා මුදල් වර්ගය
මූල්‍ය ප්‍රකාශනයන් ආයතනයේ භාවිත සහ ඉදිරිපත් කරනු ලබනා මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

ඉ) සංසන්දනාත්මක තොරතුරු

ආයතනය මගින් අදාල කරගනු ලැබූ සියළුම ගිණුම් ප්‍රතිපත්ති පූර්ව වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති හා සමානුයෝගීව අදාල කරගෙන ඇති අතර පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම්හී ඇති වෙනස්කම් හා අනුගත වන ලෙස අවශ්‍ය අවස්ථාවන්හී සංසන්දනාත්මක තොරතුරු ගලපා තිබේ

1.2 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීම

1.2.1 දේපල උපකරණ සහ පිරියත

අ) හඳුනාගැනීම සහ මැනීම

දේපල පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය අඩුකළ පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපල පිරියත සහ උපකරණයන්හී පිරිවැය යනු මිලදී ගැනීම්, ඉදිකිරීම්, සමග වන අනෙකුත් කවර හෝ අවස්ථාවෝචිත වියදම්හී එකතුව වේ.

ආ) පිරිවැය

දේපල පිරියත සහ උපකරණ පිරිවැය එහි මිලදී ගැනීම්, ඉදිකිරීම් පිරිවැය සහ අදාල වත්කම් අපේක්ෂිත කාර්යයට යොදාගනු පිණිස දරන්නට වන සෘජු පිරිවැය මගින් සමන්විත වේ.

ඇ) ක්ෂය

පහත අනුපාත යටතේ වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම් සිදු කෙරේ. වර්ෂය තුළ අත්පත් කරගන්නා ලද වත්කම් එකී වත්කම් මිලට ගනු ලැබූ මසට පසු මාසයේ පටන් ක්ෂය කිරීම අරඹනු ලබයි.

වසර තුළ විකුණන ලද වත්කම් එකී වත්කම් විකුණන ලද දවස දක්වා ක්ෂය කෙරේ.

වත්කම	ප්‍රතිශතය
ගොඩනැගිලි	5%
සන්නිවේදන උපකරණ	20%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	20%
විiාගාර සහ ඉගැන්වුම් උපකරණ	20%
පොත් සහ වාර සඟරා	20%
වාහන	20%
පිරියත සහ යන්ත්‍ර	20%
අස්පෘෂ්‍ය වත්කම්	20%

1.2.2. අස්පෘෂ්‍ය වත්කම්

I. පරිගණක මෘදුකාංග

යම් වත්කමක අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ආයතනය කරා ගලා යන්නේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මනින්නට හැකි නම් එවන් අස්පෘෂ්‍ය වත්කමක් හඳුනාගැනේ. මෘදුකාංග වත්කම් මත වන අනුෂාංගික වියදම් විශේෂිත වත්කමෙහි ඊට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරනු ලබන අවස්ථාවල පමණක් ප්‍රාග්ධනිත කෙරේ.

1.2.3. තොග

තොග වට්ටෝරු ලේඛණය ප්‍රථම ලැබීම් ප්‍රථම පිටවුම් පදනමට අගය කරනු ලැබේ. එසේම ප්‍රත්‍යාගණනය කරන ලද තොග වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට ගිණුම්වලට ඇතුලත් කරනු ලැබේ.

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

(i) ප්‍රතිලාභ සැලසුම් නීර්ණය කිරීම

හිමිකම් සහිත සේවකයන් උදෙසා 1983 අංක 12 දරණ පාරිතෝෂික ගේවීම් පණත අනුව අවශ්‍ය වන පරිදි ආයතනය නීර්ණය කරන ලද ප්‍රතිලාභ සැලසුම අදාල කරගෙන තිබේ. අවම වශයෙන් වසරක සේවා කාලයක් සතු කාර්ය මණ්ඩල සාමාජිකයන් හට පාරිතෝෂික ගෙවීම පිණිස ප්‍රතිපාදන සලසාගෙන තිබේ.

කෙසේ වතුදු 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පණත යටතේ, සේවකයකු සම්බන්ධ හිමිකම පැනනැගෙනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීම මත පමණක් වන අතර වගකීම සඳහා භාහිරින් අරමුදල් යොදවනු නොලැබේ. වගකීම් යන්න ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි කාණ්ඩගත කරනු ලැබේ.

(ii) තථ්‍ය ලාබ/ පාඩු හඳුනාගැනීම

සේවා නියුක්තිකයන්ගේ සේවා අහිමිවීම් මත වන තථ්‍ය ලාභ/ පාඩු ඒවා හටගන්නා කාලය තුළදීම පූර්ණ වශයෙන් හඳුනාගනු ලැබේ. සේවා අවසන් කිරීමේ තථ්‍ය ලාභය (විශ්‍රාම පාරිතෝෂික) රු මිලියන 6.3 ක් වන අතර එය පූර්ණ වශයෙන් හඳුනාගෙන ගැලපුම් කර මේ වසරේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි අනාවරණය කර තිබේ. පාරිතෝෂික සඳහා වන ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රතිපත්ති 19 හී සූත්‍ර භාවිතා කරමින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රතිපත්ති 19 අනුව ගණනය කර තිබේ.

(ii). නීර්ණය කරන ලද දායකත්ව සැලසුම්

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පණත අනුව සෑම සේවකයකුම විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයෙක් වේ. ඒ අනුව ආයතනය සේවකයකුගේ මූලික වැටුපින් සහ ඊට එකතු කරනු ලබනා දීමනාවලින් 15% ක් දායක කරනු ලබයි. තවද 1999 සැප්තැම්බර් 01 දින හෝ ඊට පසුව බඳවාගනු ලබනා සේවකයෝ දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයෝ වෙති. විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලට දායක කරනු ලබනා 15% න් 8%ක් දායකත්ව විශ්‍රාම අරමුදලට මාසිකව මාරු කරනු ලබයි. විශ්ව විiාල අර්ථසාධක අරමුදල සහ විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්ව විiාල ප්‍රතිපාදන කොමිසම මගින් වෙන වෙනම පරිපාලනය කරනු ලබයි.

මේ අතර ආයතන සේවකයකුගේ මාසික වැටුප සහ දීමනා වලින් 3% ක මුදලක් නීර්ණය කරන ලද සැලසුම මගින් වෙනම පරිපාලන කරනු ලබනා සේවානියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක කරනු ලබයි.

.

1.4 ආදායම හඳුනාගැනීම

පුනරාවර්තන වියදම් සඳහා වන රජයේ ප්‍රදානයන් මුදල් පදනම මත හඳුනාගැනේ. අනෙක් මෙහෙයුම් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ

1.5 කාර්ය මණ්ඩලයට දෙනු ලබනා ණය සහ අත්තිකාරම්

කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් අයකරගතයුතු තථ්‍ය ණය ශේෂයන් ලැබිය යුතු දේ මෙන් සලකනු ලබයි.

1.6 උපචිත සහ වගකීම් පිණිස වන ප්‍රතිපාදන

2024 වත්මන් ගිණුම්කරණ වර්ෂයට අදාළ ඊළඟ වසරේ ගෙවීම් මත පදනම්ව උපචිත සහ වගකීම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ.

1.7 දීමනා සඳහා ගිණුම්කරණය

මුළු ආදායම සහ රජයේ ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රතිපත්ති 11 අනුව අනාවරණය කර තිබේ.

